# 3 පරිච්ඡේදය

# මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය

## සාරාංශය

මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සහ එමගින් ඉහළ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි 2024 වසරේ දී මහ බැංකු ප්‍රතිපත්ති මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. ඉල්ලුම සහ සැපයුම් අංශවල පැවති පීඩන අඩුවීම, බාහිර අංශයේ කාර්ය සාධනය වැඩිදියුණු වීම සහ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා මධ්‍යයේ, 2024 වසරේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික තුන් වරක් අඩු කිරීමත් සමඟින් මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කළේය. ලිහිල් වූ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ලිහිල් මුදල් තත්ත්වයන්ට අනුකූලව, 2024 වසරේ දී වෙළඳපොළ පොලී අනුපාතික තවදුරටත් පහත වැටුණු අතර, එමගින් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට සාපේක්ෂ අඩු පොලී අනුපාතික යටතේ ණය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසුණු බැවින් පුද්ගලික අංශයේ ණය ප්‍රසාරණය වේගවත් වීමට සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමට සහාය ලැබුණි. වසර තුළ දී උද්ධමනය අඩු මට්ටමක පැවති අතර, බලශක්ති මිල ගණන් කිහිප වරක් අඩු කිරීම හේතුවෙන් 2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට අවධමනකාරී තත්ත්වයක් ඇති විය. ඒ අනුව, කාර්තුමය මතුපිට උද්ධමනය 2024 වසරේ අවසාන කාර්තු තුන තුළ දී මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමෙහි සඳහන් කර ඇති ආන්තිකයට වඩා පහළින් පැවති බැවින්, උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීම සහ එය නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරමින් ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළ අතර, එමගින් පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත මහ බැංකුවේ වගවීම සහතික කෙරුණි. කෙසේ වෙතත්, 2025 වසරේ දී උද්ධමනය ඉලක්කගත මට්ටම කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මිල ගණන් අඛණ්ඩව පහත වැටීම ආර්ථික ක්‍රියාකාරකම් අධෛර්යමත් කරන බැවින්, උද්ධමනය දිගු කාලීනව අඩු සහ ස්ථාවර මට්ටමක පැවතීම ගෘහ ඒකක සහ ව්‍යාපාරවලට හිතකර වේ. මහ බැංකුවේ උද්ධමන ඉලක්කකරණ රාමුවේ ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, මුදල් ප්‍රතිපත්ති වෙළඳපොළ වෙත දැනුම් දීම වඩා ශක්තිමත් කිරීමේ සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වැඩි දියුණු කිරීමේ අරමුණින්, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකින් තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට මාරු විය. මුදල් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් බැංකුවේ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා 2024 වසර තුළ දී මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති වාර්තා දෙකක් සහ මුදල් මෙහෙයුම් වාර්තාවක් ප්‍රකාශයට පත් කරන ලදී. මේ අතර, මහ බැංකුව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන අවම කිරීම සහ රටේ බාහිර ස්වාරක්ෂක වර්ධනය කිරීම සඳහා පමණක් මහ බැංකුවේ විදේශ විනිමය වෙළඳපොළ මැදිහත්වීම් සීමා විය. 2020 - 2022 කාලය තුළ දී අර්බුද කළමනාකරණ උපාය මාර්ගයේ අංගයක් ලෙස මහ බැංකුව සහ රජය විසින් පනවන ලද ආනයන සීමා කිරීම්, විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ පියවර වැනි විදේශීය අංශයට අදාළ පරිපාලන ක්‍රියාමාර්ග, වර්ධනය වූ විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්ව සහ සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවති විදේශීය අංශය සැලකිල්ලට ගනිමින්, 2024 වසරේ දී තවදුරටත් ක්‍රමානුකූලව ඉවත් කරන ලදී. මූල්‍ය අංශය සම්බන්ධයෙන් ගත් කල, බලපත්‍රලාභී බැංකු පාලනය සඳහා වන නීතිමය රාමුව ශක්තිමත් කරමින්, 2024 වසරේ අප්‍රේල් මාසයේ දී 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත බලාත්මක කරන ලදී. බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන යන දෙඅංශය ම සඳහා අවදානම් කළමනාකරණය සහ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් නියාමන පියවර මාලාවක් මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම අපේක්ෂාවෙන්, බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණ සැලැස්මෙහි දෙවන අදියරය 2024 දෙසැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. මේ අතර, අර්බුදයට ලක් වූ ව්‍යාපාරවලට යළි නැගී සිටීමට සහනයක් සැපයීම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම පිණිස මහ බැංකුව බලපත්‍රලාභී බැංකුවලට මාර්ගෝපදේශ නිකුත් කළේය. ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම සඳහා, රටේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස, මහ බැංකුව සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුව ප්‍රකාශයට පත් කළේය. බලපත්‍රලාභී බැංකු සම්බන්ධයෙන් නිරාකරණ සැලසුම් සහ රාමුව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව 2024 වසර තුළ දී කැපී පෙනෙන ප්‍රයත්න දැරුවේය. සමාජයේ සියලුම කොටස්වල මූල්‍ය සාක්ෂරතාවය සහ හැකියාවන්

වර්ධනය කිරීමේ අරමුණින්, 2024 වසරේ මැයි මාසයේ දී මහ බැංකුව විසින් ශ්‍රී ලංකාව සඳහා මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය දියත් කරන ලදී. තවද, ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමට සහ එවැනි ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව වැඩි දියුණු කිරීමට මහ බැංකුව නොයෙකුත් පියවර ගත් අතර, ඵලදායීතාව වැඩි කිරීම සඳහා ආර්ථිකයේ ඩිජිටල්කරණ ප්‍රයත්නවලට මෙයින් දායකත්වය ලැබුණි. මෙයට අමතරව, 2024 වසරේ අගෝස්තු වන විට මහ බැංකුව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි සම්පූර්ණයෙන් ම බලාත්මක කළ අතර, එමගින් රට තුළ මූල්‍ය සේවාවන්හි විනිවිදභාවය, සාධාරණත්වය සහ වගවීම තහවුරු කිරීම සඳහා වන රාමුව ශක්තිමත් කරන ලදී. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක කිරීමත් සමඟ මහ බැංකුව විසින් සිදු කරනු ලබන රාජ්‍ය ණය කළමනාකරණ කාර්යයන් මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද නව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට ක්‍රමයෙන් පැවරීම මේ වන විට සිදු කෙරේ. මූල්‍ය අංශයේ විශ්වසනීය බව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය ජාත්‍යන්තර මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රමිතීන්ට අනුකූලව අඛණ්ඩව ක්‍රියාත්මක විය.



## 3.1 මුදල් ප්‍රතිපත්ති රාමුව

**2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන යෑම මහ බැංකුවේ මූලික අරමුණ වන අතර නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය එහි මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස දක්වයි.** මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මුදල් ප්‍රතිපත්තිය සැකසීමට සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම මහ බැංකුවට පැවරී ඇත. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි මහ බැංකුව විසින් සපුරා ගැනීමට අවශ්‍ය උද්ධමන ඉලක්කය පිළිබඳව මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා එකඟතාවයකට එළඹ ඇත. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, මහ බැංකුව විසින් කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක ඉලක්කගත අගයක පවත්වා ගැනීම අවශ්‍ය වේ. උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික අපේක්ෂිත දිශානතිය ඔස්සේ මෙහෙයවීමට මහ බැංකුව සිය ප්‍රතිපත්ති උපකරණ භාවිතා කරයි.

**නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ ක්‍රියාත්මක කරන ලද වැඩිදියුණු කිරීමක් ලෙස, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී මහ බැංකුව එහි ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත ප්‍රවිෂ්ට විය.** ඒ අනුව, මූල්‍ය වෙළඳපොළ සහ සමස්ත ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්තිය නිවේදනය කිරීමේ සහ සම්ප්‍රේෂණය කිරීමේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුවේ ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දෙන ලදී.[1] නව ක්‍රමවේදය යටතේ ද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස අඛණ්ඩව පවතී. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට අවතීර්ණ වීමත් සමඟ, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රකාශිත එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ ආසන්නයේ පවත්වා ගැනීමට මහ බැංකුව අදහස් කරයි. මෙම වෙනස් කිරීමත් සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලැබේ. කෙසේ වෙතත්, ඒවා මහ බැංකුවේ නිත්‍ය පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාතික ලෙස අඛණ්ඩව පවතිනු ඇති අතර අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතික සඳහා පහළ සහ ඉහළ සීමා ලෙස ක්‍රියා කරයි. මේ අතර, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය කලින් තීරණය කළ ආන්තිකයකින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ වී ඇති අතර, දැනට එය පදනම් අංක ±50ක් ලෙස නිර්ණය කර ඇත. ඒ අනුව, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමත් සමඟ, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00%ක් ලෙස නිර්ණය කරන ලද අතර, මුදල් වෙළඳපොළ මෙහෙයුම් කටයුතු ඉහත වෙනස් කිරීමට පහසුකම් සලසන ලෙස වෙනස් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ ක්‍රමයෙන් අනුකූල වූ අතර අනතුරුව එක්දින ප්‍රතිපත්ති අනුපාතිකයෙහි හෝ ඊට ආසන්නයේ පැවතුණි.

**මහ බැංකු අරමුණු ඵලදායී ලෙස ඉටු කර ගැනීම සඳහා මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වය වැඩිදියුණු කිරීමට පහසුකම් සපයන අතර ම, මහ බැංකුව විසින් ඉහළ විනිවිදභාවයක් සහ මහජන වගවීමක් පවත්වා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි අවශ්‍යතාවයකි.** මිල ස්ථායීතාව සම්බන්ධයෙන්, මහ බැංකුව උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වුවහොත්,[2] ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අතර, එය මහජනතාවට ද ලබා ගත හැකි විය

1 පහත සබැඳිය තුළින් https://www.cbsl.gov.lk/sites/default/files/cb-slweb_documents/statistics/otherpub/concept_note_on_opr_e.pdf තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය පිළිබඳ විස්තරාත්මක සටහන වෙත ප්‍රවේශ විය හැකිය.

2 කාර්තුමය සාමාන්‍ය (වාර්ෂික ලක්ෂ්‍යමය) මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම්ව) අඛණ්ඩව කාර්තු දෙකක් සඳහා ඉලක්කගත අනුපාතිකයෙන් ප්‍රතිශතාංක ±2 ආන්තිකයකින් අපගමනය වීම

යුතුය. උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගනු ලබන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් වාර්තාවේ දක්වා තිබිය යුතුය.[3] තවද, උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා, උද්ධමනයට බලපාන සාධක, උද්ධමනය සඳහා මැදි කාලීන පුරෝකථන සහ එවැනි පුරෝකථන සඳහා ඇති මූලික අවදානම්, සමඟ ම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පැහැදිලි කරන ද්විවාර්ෂික වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි අවශ්‍යතාවයකි. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා, මහ බැංකුව සෑම වසරක ම පෙබරවාරි සහ අගෝස්තු මාසවල දී මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කරයි. තවද, මහ බැංකුවේ කාර්යයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අධිපතිවරයා, පාලක මණ්ඩල සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් සහ නියෝජ්‍ය අධිපතිවරු පාර්ලිමේන්තුවට හෝ එහි කමිටුවලට කැඳවිය හැකිය. මෙම අවශ්‍යතාවය සපුරාලීමේ දී, එවැනි කමිටුවල ඉල්ලීම පරිදි පාර්ලිමේන්තු කමිටුවලට නිලධාරීන් සහභාගී වීමට අමතරව, 2024 වසරේ සැප්තැම්බර් සහ 2025 වසරේ ජනවාරි මාසවල දී මහ බැංකුවේ කාර්යයන් පිළිබඳව පාර්ලිමේන්තුව සහ/හෝ එහි කමිටු දැනුම්වත් කිරීම සඳහා පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් සහ මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ඉඩ ප්‍රස්ථා ලබා ගන්නා ලදී. එපමණක් නොව, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණෙන් ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ සම්බන්ධීකරණ සභාව පිහිටුවා ඇත. මෑත කාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමට මෙන්ම මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීමට සම්බන්ධීකරණ සභාව කාර්තුමය වශයෙන් රැස්වේ.

## 3.2 මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ක්‍රියාමාර්ග

**2023 වසර අවසාන භාගයේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස ලිහිල් කිරීම අනුව යමින් 2024 වසර තුළ දී ද මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කරන ලදී.** ආර්ථික කටයුතු සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම මධ්‍යයේ උද්ධමනය අඩු වීම, උද්ධමන අපේක්ෂා මනාව පාලනය වීම, දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම මගින් 2024 වසර තුළ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කිරීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් ලැබුණි. 2023 වසර අවසාන භාගයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 650කින් සැලකිය යුතු ලෙස අඩු කිරීම සහ ඉහළ මට්ටමක පැවති වෙළඳපොළ ණය පොලී අනුපාතික අඩු කිරීමට අවශ්‍ය පුළුල් මාර්ගෝපදේශ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කිරීම හේතුවෙන් සමස්ත පොලී අනුපාතික ව්‍යුහය පහළ ගියේය. එහෙත්, පොලී අනුපාතික, විශේෂයෙන් වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ යෑමේ වේගයේ යම් මන්දගාමී වීමක් පෙන්නුම් කෙරිණි. අඩු උද්ධමන පරිසරය සහ උද්ධමන ඉදිරි දැක්මට අනුකූලව වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් පහළ යෑම සඳහා ඇති අවකාශය සලකා බැලීමෙන් අනතුරුව, මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික 2024 මාර්තු මාසයේ දී පදනම් අංක 50කින් අඩු කළ අතර, 2024 ජූලි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25කින් තවදුරටත් අඩු කළේය. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් ණය ගැනීමේ පිරිවැය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එමගින් පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වීමට සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම සඳහා සහාය සැලසිණි. ඉන් අනතුරුව, වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම මන්දගාමී වීම, උද්ධමන ඉදිරි දැක්ම සහ උද්ධමන අපේක්ෂා අඩු මට්ටමක පැවතීම හේතුවෙන් 2024 නොවැම්බර් මාසයේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සුපරීක්ෂාකාරී ලෙස තවදුරටත් ලිහිල් කිරීමට මහ බැංකුව කටයුතු කළේය. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමු වීම පිළිබිඹු කරමින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමත් සමඟ මුදල් ප්‍රතිපත්තිය පදනම් අංක 50කින් පමණ ලිහිල් කිරීමක්[4] සිදු විය. ඒ අනුව, 2024 වසර අවසානය වන විට පවතින ලිහිල් මුදල් ප්‍රතිපත්ති චක්‍රය තුළ ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ සමස්ත අඩු කිරීම පදනම් අංක 775ක් පමණ විය.

**2024 වසර තුළ දී දේශීය මුදල් වෙළඳපොළ සමස්ත ද්‍රවශීලතාව අතිරික්ත මට්ටම්වල පැවතුණ ද එහි අසමමිතික ව්‍යාප්තිය හේතුවෙන් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අරමුදල් සැපයීම සඳහා මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු අඛණ්ඩව සිදු කළේය.** බලපත්‍රලාභී වාණිජ බැංකු නිත්‍ය පහසුකම් සඳහා වැඩි වශයෙන් යොමු වීම වැළැක්වීම පිණිස 2023 ජනවාරි සිට නිත්‍ය පහසුකම් භාවිතා කිරීම මත පනවන ලද සීමා 2024 වසරේ මුල් කාලයේ දී ඉවත් කරන ලදී. මෙය වැඩිදියුණු වූ වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව සහ වෙළඳපොළ ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගනිමින් සිදු කරන ලදී. ඒ අනුව, 2024 පෙබරවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය ණය පහසුකම භාවිතය සඳහා පනවා තිබූ සීමාව ඉවත් කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම සඳහා වූ සීමාව මාසයක් තුළ පස් වතාවක සිට දස වතාවක් දක්වා ලිහිල් කරන ලද අතර, පසුව 2024 අප්‍රේල් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එම සීමාව ඉවත් කරන

3 උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනයේ අපගමනයන් සම්බන්ධයෙන්, මහ බැංකු පනතෙහි 26(5) වගන්තිය යටතේ අවශ්‍ය වාර්තා වෙත මහ බැංකු වෙබ් අඩවිය ඔස්සේ ප්‍රවිෂ්ට විය හැකිය.

4 ප්‍රතිපත්ති වෙනස් කිරීමට පෙර වාර්තා වූ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අතර වෙනස මගින් ගණනය කර ඇත.

## විශේෂ සටහන 3
## තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම

### හැඳින්වීම

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩිදියුණු කිරීම්වල තවත් අංගයක් ලෙස, 2024 නොවැම්බර් 27 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව මෙතෙක් පැවති ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ සිට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමු විය.[1] ඒ අනුව, මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම්දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එහි ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) හඳුන්වා දුන්නේය. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම තුළින් මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය සරල කිරීම සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අරමුණු කෙරේ.

### තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක අවශ්‍යතාවය

ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයේ සිට, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ විධිමත් ලෙස පිළිගෙන ඇති වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව වන, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය දක්වා ඉදිරියට පැමිණ ඇත. මෙම පනත මගින් දේශීය මිල ස්ථායිතාව පවත්වා ගැනීම මහ බැංකුවේ ප්‍රධාන අරමුණ ලෙස පිළිගෙන ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි සාර්ථකත්වය බොහෝ දුරට රඳා පවතින්නේ ප්‍රතිපත්ති වෙනස්කම් ඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීම සහ උද්ධමන අපේක්ෂාවන් මනාව පාලනය වීම මතය. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙළඳපොළට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට පැහැදිලි ලෙස දැනුම්දීම මෙම කාරණා ද්විත්වය කෙරෙහි බලපානු ලබයි. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක් සහිත ප්‍රතිපත්ති උපකරණයක් මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා වඩාත් සුදුසු වේ.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය හඳුන්වාදීමට පෙර මහ බැංකුව විසින් ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික සහිත කොරිඩෝ ක්‍රමයක් යටතේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් සිදු කරන ලදී. එහි ඉහළ සීමාව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) සහ පහළ සීමාව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) විය. මෙම කොරිඩෝව මගින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස සලකනු ලබන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)[2] මෙහෙයවන ලදී. කෙසේ වෙතත්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙළඳපොළට ගලායාමේ විනිවිදභාවය අඩුවීම සහ සංකීර්ණත්වය වැනි දුර්වලතා ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය තුළ ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි. ප්‍රතිපත්ති පොලී අනුපාතික දෙකක් භාවිතා කරමින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ප්‍රකාශයට පත් කිරීම සහ අන්තර් බැංකු මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකය, එනම් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පොලී අනුපාතික කොරිඩෝව තුළ විචලනය වීම වෙළඳපොළ සහභාගිවන්නන් අතර යම් අවිනිශ්චිතතාවයක් ඇති කරන ලදී. තවද, පොලී අනුපාතික කොරිඩෝව තුළ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ස්ථානගත කළ යුත්තේ කොතැනද යන්න සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි වෙනස්කම් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්කම් ලෙස සැලකිය හැකිද යන්න පිළිබඳ පැහැදිලි භාවයක් නොතිබුණි. මෙම විනිවිදභාවය අඩුකම හේතුවෙන් වෙළඳපොළ සහභාගිවන්නන්ට මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති අභිප්‍රායන් නිවැරදිව අර්ථ නිරූපණය කිරීම ඇතැම්විට සංකීර්ණ වන්නට ඇත.

තවද, මූල්‍ය ආයතනයන්හි තැන්පතු සහ ණය පොලී අනුපාතික නියම කිරීම සඳහා ප්‍රධාන පදනම් දර්ශකයක් ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික භාවිතා කිරීම හේතුවෙන්, ප්‍රතිපත්ති පොලී අනුපාතික කිහිපයක් පැවතීම මූල්‍ය උපකරණ මිලකරණයේ සංකීර්ණතාවයන්ට හේතු වන්නට ඇත. ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ පැවති මෙම සංකීර්ණතා හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ පොලී අනුපාතිකවල වෙනස් වීම මන්දගාමී වීමට හැකියාව පැවති අතර, එමගින් මුදල් ප්‍රතිපත්තිය හරහා ආර්ථිකයට සිදුකළ හැකි බලපෑමේ ප්‍රමාණය අඩු විය.

ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ දැනුම්දීම සහ සන්නිවේදනය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය සලකා බලමින්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව කරා යොමුවීම සඳහා වන ඉදිරි දැක්ම අනුව, තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා කටයුතු ආරම්භ කිරීමට මහ බැංකුව පියවර ගත්තේය. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය කරා යොමුවීමේ මූලික පියවර ලෙස මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික මගින් නිර්මාණය වූ පොලී අනුපාතික කොරිඩෝවේ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු කළේය. තවද, ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණය හරහා බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත මට්ටමක පවත්වා ගෙන ගිය අතර, එමගින් මහ බැංකුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් කරා පහසුවෙන් යොමු වීමට සහාය ලැබුණි. ඉන් අනතුරුව, ජාත්‍යන්තර වශයෙන් ප්‍රශස්ත භාවිතයන් අනුව යමින්, ප්‍රතිපත්ති මට්ටමේ සාකච්ඡා සහ පාර්ශ්වකරුවන් සමඟ සිදු කරන ලද සාකච්ඡාවලින් පසුව, මහ බැංකුව 2024 නොවැම්බර් මාසයේ දී තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය හඳුන්වා දුන්නේය.

---

1 මෙම ප්‍රතිපත්ති වෙනස්කම පිළිබඳ වැඩි විස්තර සඳහා "ශ්‍රී ලංකා මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දෙමින් තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරයි" යන මාධ්‍ය නිවේදනය සහ https://www.cbsl.gov.lk/sites/default/files/concept_note_on_opr_e.pdf හි තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විස්තරාත්මක සටහන බලන්න

2 බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය යනු සලකා බලන දිනයකදී බලපත්‍රලාභී වාණිජ බැංකු අතර එක්දින පදනම මත සුරැකුම් රහිතව සිදු කරනු ලබන අන්තර් බැංකු ඒක්ෂණ මුදල් ගනුදෙනු මත බර තබන ලද පොලී අනුපාතිකයයි.

### තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක ප්‍රතිලාභ

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම මගින් ප්‍රතිලාභ ගණනාවක් අත්වන අතර, එමගින් මුදල් ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස ඉහළ නංවනු ලබයි. මූල්‍ය වෙළඳපොළවලට පැහැදිලි සහ ස්ථාවර සංඥා ලබා දීමෙන්, ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ අවිනිශ්චිතභාවය අඩු කෙරෙන අතර, වෙළඳපොළ සහභාගිවන්නන්ට වැඩි විශ්වාසයකින් යුතුව දැනුම්වත් තීරණ ගැනීමට පහසුකම් සපයයි. මෙම වැඩිදියුණු වූ විනිවිදභාවය මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ශක්තිමත් කරන අතර, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්කම් කෙටි කාලීන පොලී අනුපාතික වෙතට සහ එමගින් ආර්ථිකය වෙත ඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීම සහතික කරයි.

තවද, පදනම් පොලී අනුපාතිකය ලෙස ක්‍රියා කරන තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක් තිබීම මගින් මූල්‍ය ආයතනවලට තම මූල්‍ය උපකරණ වඩාත් නිරවද්‍යතාවයකින් මිල කළ හැකි අතර, වෙළඳපොළ පොලී අනුපාතිකවල විෂමතා නිර්මාණය වීම අවම කරයි. මෙමගින්, මූල්‍ය පද්ධතිය තුළ අරමුදල් ගලා යෑම වැඩි කිරීම, වඩා හොඳ ද්‍රවශීලතා කළමනාකරණයට පහසුකම් සැපයීම, සහ පුරෝකථනය කළ හැකි පොලී අනුපාතික පරිසරයක් නිර්මාණය වීම සිදු වන අතර එය ආයෝජක විශ්වාසය වර්ධනය සඳහා වැදගත් වේ.

### තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ මෙහෙයුම් ක්‍රියාවලිය


තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ මෙහෙයුම් රාමුව, කෙටි කාලීන පොලී අනුපාතික මනාව පාලනය කිරීම හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීම සඳහා නිර්මාණය කර ඇත. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රකාශිත එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මට්ටමේ හෝ ඒ ආසන්නයේ පවත්වා ගැනීමට මහ බැංකුව ඉලක්ක කරයි. තවද, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් අවශ්‍ය පරිදි එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වරින් වර සමාලෝචනය කර වෙනස් කරනු ඇත.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයට යොමුවීමෙන් පසුව, ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය යටතේ මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකන ලද නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලැබේ. කෙසේ වෙතත්, මහ බැංකුව සමඟ එක්දින ගනුදෙනු සඳහා සහභාගීවන ආයතන සඳහා නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම සඳහා අදාළ වන පොලී අනුපාතික ලෙස, පිළිවෙළින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තව දුරටත් පවතිනු ඇත.[3] මෙයට අමතරව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, මහ බැංකුව විසින් තීරණය කරන ලද ආන්තිකයන් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හා සම්බන්ධ කර ඇති අතර මෙම අනුපාතික අන්තර් බැංකු ඒක්ෂණ මුදල් ගනුදෙනු මෙන්ම එක්දින සහ කෙටි කාලීන විවෘත වෙළඳපොළ කටයුතු සඳහා පහළ සහ ඉහළ සීමාවන් නිර්ණය කරයි.

ඒ අනුව, එක්දින සහ කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි ලංසු තැබීම සඳහා ඉහළ සීමාව ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයත්, එම ලංසු සඳහා අදාළ පහළ සීමාව ලෙස නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයත් සලකනු ලබයි. වෙළඳපොළෙන් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස මහ බැංකුව ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි පවත්වයි. සහභාගීත්ව ආයතන අතර අතිරික්ත ද්‍රවශීලතාවයක් පවතින විට, ඔවුන්ට විකල්ප දෙකක් පවතී. ඒ අනුව, ඔවුන්ට තම අතිරික්ත අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ මහ බැංකුවේ තැන්පත් කිරීමට හෝ ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිවලට සහභාගී වීම තෝරා ගත හැකිය. සහභාගී වන ආයතන සඳහා ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි ආකර්ෂණීයව පවත්වා ගැනීම සඳහා මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයට සමාන මට්ටමේ අවම ලංසු අනුපාතිකයක් ද, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමාන මට්ටමේ උපරිම ලංසු අනුපාතිකයක්ද ස්ථාපිත කර ඇත. සහභාගීත්ව ආයතනවලට සෑම විටම ඔවුන්ගේ අතිරික්ත අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පත් කිරීමේ විකල්පය ඇති බැවින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, එක්දින සහ කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි පැවැත්වීම සඳහා පවතින ඵලදායී අවම අනුපාතිකය වේ.

3 නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යනු නිත්‍ය තැන්පතු පහසුකම යටතේ එක්දින පදනම මත සහභාගීත්ව ආයතන විසින් මහ බැංකුවේ අතිරික්ත අරමුදල් තැන්පත් කිරීම මත ගෙවීම් කරනු ලබන අනුපාතිකය වන අතර, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යනු නිත්‍ය ණය පහසුකම යටතේ සහභාගීත්ව ආයතන, මහ බැංකුවෙන් එක්දින පදනම මත අරමුදල් ණයට ලබා ගත හැකි අනුපාතිකයයි.

**වි.ස. 3.1 රූප සටහන: තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ව්‍යුහය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


3

මේ අතර, එක් දින සහ කෙටි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි සඳහා ඉහළ සීමාව ලෙස නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයත් එහි පහළ සීමාව ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයත් පවතී. වෙළඳපොළට ද්‍රවශීලතාවය සැපයීම සඳහා මහ බැංකුව ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වනු ලබයි. සහභාගීත්ව ආයතන ද්‍රවශීලතා හිඟයකට මුහුණ දෙන විට, ඔවුන්ට ද විකල්ප දෙකක් තිබේ. ඔවුන්ට නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ මහ බැංකුවෙන් අරමුදල් ණයට ලබා ගැනීමට හෝ සුදුසු සුරැකුම්පත් ඇපයට තබා ප්‍රකාශිත ප්‍රතිවිකුණුම් වෙන්දේසිවලට සහභාගී වී ද්‍රවශීලතාව ලබා ගත හැකිය. ප්‍රතිවිකුණුම් වෙන්දේසිවල තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා, මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමාන මට්ටමේ අවම ලංසු අනුපාතිකයක් නියම කරන අතර, උපරිම ලංසු අනුපාතිකය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට සමාන කර ඇත. සහභාගීත්ව ආයතනවලට නිත්‍ය ණය පහසුකම වෙතින් ණය ලබාගැනීමේ විකල්පය ඇති බැවින්, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින සහ කෙටි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම සඳහා පවතින ඵලදායී උපරිම අනුපාතිකය වේ.

### එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමෙන් පසු මුදල් වෙළඳපොළ ක්‍රියාකාරීත්වය

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය හඳුන්වාදීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂා කළ පරිදි ක්‍රමයෙන් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය කරා ළඟා වූ අතර, 2024 දෙසැම්බර් දෙවන සතියේ සිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ආසන්නයේ පැවතුණි. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය දක්වා බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ සිදු වූ මෙම වේගවත් ගැළපීම සඳහා අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් වැඩිවීම බොහෝ දුරට සහාය විය. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය කරා සුමට ගමන් කිරීමක් පෙන්නුම් කරමින්, වර්තමානයේදී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මට්ටමේ හෝ ඒ ආසන්නයේ පවතී. තවද, තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමය වෙත වෙළඳපොළ ඉතා ඉක්මනින් හැඩගැසීම පිළිබිඹු කරමින්, කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතිකවල ගැළපීම් දැනටමත් අනෙකුත් වෙළඳපොළ පදනම් පොලී අනුපාතික වෙත සම්ප්‍රේෂණය වී ඇත.

වි.ස. 3.2 රූප සටහන: එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ නිත්‍ය පහසුකම් අනුපාතික




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් කරා යොමුවීම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමේ සැලකිය යුතු පියවරක් සනිටුහන් කරයි. මෙමගින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරෙන අතර, වෙළඳපොළ පුරෝකථන හැකියාව වැඩිදියුණු කරනු ලබයි. මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්වල පැහැදිලි බව ඉහළ යෑමත් සමඟ ද්‍රවශීලතා කළමනාකරණය ද විධිමත් වීම හරහා මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය ද ශක්තිමත් වනු ඇත. මෙම වෙනස්වීම මගින් මහ බැංකුවේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල විශ්වසනීයත්වය ද වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, එය වෙළඳපොළ සහ ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්ති දැනුම්දීමේ සහ සම්ප්‍රේෂණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය සහතික කරනු ඇත. සමස්තයක් වශයෙන්, මුදල් ප්‍රතිපත්ති ඵලදායීතාවය වැඩිදියුණු වීම, ස්ථාවර ආර්ථිකයක් ඇති කිරීමට, ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු කිරීමට මෙන්ම අවසාන වශයෙන් ආර්ථිකයේ මිල ස්ථායිතාව පවත්වා ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වේ.

ලදී. දේශීය මුදල් වෙළඳපොළ සමස්ත ද්‍රවශීලතාව 2024 වසර තුළ දී ක්‍රමයෙන් වැඩි වී සැලකිය යුතු අතිරික්ත මට්ටම් දක්වා ඉහළ ගිය ද සහභාගීත්ව ආයතන අතර අසමමිතික ද්‍රවශීලතා ව්‍යාප්තිය මගින් වෙළඳපොළ පොලී අනුපාතික අඩුවීමේ ක්‍රියාවලියට ඇති කරන බලපෑම අවම කිරීම සඳහා මහ බැංකුව විසින් ද්‍රවශීලතා සැපයීමේ කටයුතු (ප්‍රතිවිකුණුම් වෙන්දේසි) අඛණ්ඩව සිදු කරන ලදී. ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු වීමත් සමඟ විදේශීය බැංකු විසින් මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් සඳහා පැවති ප්‍රතිපාර්ශ්වීය සීමා ලිහිල් කිරීමේ සහාය ලබමින් 2024 වසරේ අග භාගය වන විට දේශීය මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් වැඩිදියුණු වූ අතර ම ද්‍රවශීලතා අතිරික්තය ඉහළ ගියේය. ද්‍රවශීලතාව ඉහළ යෑම සහ අසමමිතික ද්‍රවශීලතා ව්‍යාප්තිය අවම වීමත් සමඟ එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම හරහා ද්‍රවශීලතා සැපයීම සීමා කිරීම ඇතුළු විවට වෙළඳපොළ කටයුතු ක්‍රමයෙන් අඩු කිරීමට මහ බැංකුවට ඉඩ සැලසුණි.

**උද්ධමනය එහි ඉලක්කයෙන් අපගමනය වූ, අවධමනකාරී පරිසරයක් තුළ, පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා කළමනාකරණය කිරීම සහ තම ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කිරීම වැඩිදියුණු කිරීමේ අරමුණු ඇතිව මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව සැලසුම් කිහිපයක් වසර පුරාම ක්‍රියාත්මක කළේය.** සාම්ප්‍රදායික ප්‍රතිපත්ති මෙවලම් අඛණ්ඩව භාවිතා කරන අතර ම, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වන කුටුම්බ සහ ව්‍යාපාරවල හැසිරීම කෙරෙහි මග පෙන්වීම සඳහා වැඩි අවධානය යොමු විය. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති තීරණ, ඒවා ගැනීමට බලපෑ හේතු, සහ විශේෂයෙන් ම, උද්ධමන පුරෝකථන ඇතුළත්, ආර්ථික ඉදිරි දැක්ම පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කළේය. විශේෂයෙන් ම, වසරේ අග භාගයේ දී දක්නට ලැබුණු අවධමනකාරී තත්ත්ව, ඉල්ලුම නොමැතිකම හෝ ආර්ථික ක්‍රියාකාරකම් නිසා නොව සැපයුම මත පදනම් වූ තාවකාලික සාධක නිසා ඇති වූ බැවින්, අපේක්ෂා කළමනාකරණය කිරීමේ දී මෙම ප්‍රයත්න ඉතා වැදගත් විය. මාධ්‍ය නිවේදන සහ අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සජීවී මාධ්‍ය හමු මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපාය මාර්ගයේ කේන්ද්‍රීය ස්ථානයක් හිමිකර ගත් අතර, මුදල් ප්‍රතිපත්ති තීරණ පිළිබඳ තථ්‍ය කාලීන අවබෝධයක් ලබා දුන්නේය. මුදල් ප්‍රතිපත්තිය සහ සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ විවේචනාත්මක හා බුද්ධිමය සාකච්ඡා බොහොමයක් සහිතව මාධ්‍ය සහභාගීත්වය අඛණ්ඩව වැඩිදියුණු විය. මීට අමතරව, විශාල පිරිසකට භාවිතය පහසු වන පරිදි, ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා ජාතික භාෂාවලින් නිර්මාණය කරන ලද තනි පිටුවක පළ කරන ලද කෙටි විස්තර සහ කෙටි වීඩියෝ කොටස් ඇතුළු සරල සන්නිවේදන ආකෘති සහ සමාජ මාධ්‍ය භාවිතය ඉහළ නැංවීය. ඉලක්කගත දැනුම්වත් කිරීමේ වැඩසටහන්, අභ්‍යන්තරව හා බාහිරව නිතර පවත්වනු ලැබූ මංගත සම්මන්ත්‍රණ සහ සිසුන්, ගුරුවරුන් සහ රජයේ නිලධාරීන් ඉලක්ක කරගත් දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

**ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුකූලව, අවශ්‍ය පරිදි වාර්තා ප්‍රකාශයට පත් කිරීම හරහා විනිවිදභාවය සහ වගවීම තහවුරු කිරීමට මහ බැංකුව කැපවී සිටියි.** 2024 වසරේ පෙබරවාරි සහ අගෝස්තු මාසවල ප්‍රකාශයට පත් කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තා මගින් පෙර මුදල් ප්‍රතිපත්ති තීරණ සහ අදාළ විශ්ලේෂණ ලේඛනගත කිරීම පමණක් නොව, උද්ධමන පුරෝකථන සහ පුරෝකථනවලට ඇති අවදානම් වැනි ඉදිරි දැක්මක් සහිත අවබෝධයක් ද ලබා දුන්නේය. විවේචනාත්මක සංවාද සහ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා, මහ බැංකුව විසින් මාධ්‍යවේදීන්, ශාස්ත්‍රඥයින් සහ විවිධ අංශවල විශේෂඥයින් සම්බන්ධ කර ගනිමින්, සංවාදාත්මක අදහස් හුවමාරු කිරීම් සහිත, තාක්ෂණික සාකච්ඡා සැසි පවත්වන ලදී. ඒ ආකාරයට, මෙම ක්‍රියාමාර්ග උද්ධමන අපේක්ෂා ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට බාධාවක් විය හැකි, තොරතුරුවල අසමමිතිකබව අඩු කිරීම අරමුණු කර ගෙන ඇත. ඒ හා සමානව, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමට පෙර පාර්ශ්වකරුවන් බහුවිධ ආකාරයෙන් දැනුම්වත් කරන ලදී. ඒ අනුව, මූල්‍ය ආයතන සහ මහජනතාව ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන් මෙම වෙනස් කිරීම පිළිබඳව හොඳින් දැනුම්වත් කිරීම සහතික කිරීම සඳහා මහ බැංකුව බහුවිධ සන්නිවේදන උපාය මාර්ගයක් ක්‍රියාත්මක කළේය. සහභාගීවන ආයතන සමඟ පූර්ව දැනුම්වත් කිරීමේ සැසි පැවැත්වීම, නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට පෙර මාධ්‍ය නිවේදන නිකුත් කිරීම, වෙනස් කිරීම පැහැදිලි කරන විස්තරාත්මක සටහනක් ප්‍රකාශයට පත් කිරීම, සහ විවිධ පාර්ශ්වකරුවන් සඳහා මෙම වෙනස් වීම අදාළ වන ආකාරය පැහැදිලි කෙරෙන පරිදි භාෂා තුනෙන්ම පුවත්පත් ලිපි පළ කිරීම මෙම ප්‍රයත්නවලට ඇතුළත් විය. 2024 වසරේ දෙවන සහ තුන්වන කාර්තුවල මෙන්ම 2024 වසරේ තුන්වන සහ සිව්වන කාර්තුවල, අඛණ්ඩව කාර්තු දෙකක් සඳහා කාර්තුමය උද්ධමනය එහි ඉලක්කයට වඩා ප්‍රතිශතාංක දෙකකින් පහළ යෑමෙන් පසුව, ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 26(5) වගන්තියට අනුකූලව, මහ බැංකුව ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළේය.[5] විශේෂයෙන් ආයතනික ස්වාධීනත්වය ඉහළ යෑම මධ්‍යයේ, මෙම වාර්තා සැපයීමෙන් පසුව රජය සමඟ පැවති සාකච්ඡා සහ විචාරණ මහජන වගවීම සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුවේ කැපවීම ශක්තිමත් කළේය. සමස්ත මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපාය මාර්ගයේ කොටසක් ලෙස, 2024 වසරේ දී අර්ධ වාර්ෂික වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව ප්‍රකාශයට පත් කිරීම ද මහ බැංකුව ආරම්භ කළේය. විවෘත වෙළඳපොළ කටයුතු, ද්‍රවශීලතා කළමනාකරණය, කෙටි කාලීන පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළු මුදල් මෙහෙයුම් පිළිබඳ තොරතුරු මෙම ප්‍රකාශනය මගින් සපයනු ලබයි.

**විදේශ විනිමය වෙළඳපොළ ශක්තිමත් කිරීම, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ විදේශීය අංශයේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී මහ බැංකුව ප්‍රධාන මුලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කළේය.** නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් පවත්වා ගැනීමට මහ බැංකුව වසර පුරා අඛණ්ඩව කටයුතු කළ අතර, අධික විචලනයන් අවම කිරීමට සහ වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම හරහා සංචිත ගොඩනගා ගැනීමට පමණක් විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් විය. ආර්ථික කම්පනවලට ප්‍රතිචාර වශයෙන් සිදුවන ස්වයංක්‍රීය ගැළපීම මගින්

5 මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමේ දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනයේ අපගමනය පිළිබඳ පළමු වාර්තාවට (අදාළ කාලය: 2024 වසරේ දෙවන සහ තුන්වන කාර්තුව) https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/monetary_policy/report_on_deviation_of_inflation_target_Q2_and_Q3_2024_s.pdf ඔස්සේ ප්‍රවේශ විය හැකිය. පසුව සඳහන් කළ වාර්තාව ද ඉදිරි කාල සීමාව තුළ ලබා ගත හැකි වනු ඇත.

3

## විශේෂ සටහන 4
## මුදල් ප්‍රතිපත්තිමය වගවීම සහ උද්ධමන ඉලක්ක

### හැඳින්වීම

මහ බැංකුවක් විසින් සිය මුදල් ප්‍රතිපත්ති තීරණ පැහැදිලි කිරීම සහ සාධාරණීකරණය කිරීම මෙන්ම එම තීරණ මගින් පාර්ශ්වකරුවන්හට ඇති කරන බලපෑම පැහැදිලි කිරීම මුදල් ප්‍රතිපත්තිමය වගවීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම සාධාරණීකරණය වැදගත් වන්නේ එමගින් මහ බැංකුව විනිවිදභාවයෙන් යුතුව සහ විශ්වාසදායීව එහි ස්වාධීනත්වය පවත්වා ගැනීම තහවුරු කරන බැවිනි. මහ බැංකුවෙහි වගවීම මගින් එහි තීරණ දේශපාලනික හෝ බාහිර බලපෑම්වලින් තොරව ආර්ථිකය පිළිබඳ තර්කානුකූල හේතු මගින් මෙහෙයවනු ලබන බව සනාථ කරමින්, ජනතාව, ව්‍යාපාර සහ ආයෝජකයින් අතර විශ්වාසය ශක්තිමත් කෙරේ. මෙම විශ්වාසය උද්ධමන අපේක්ෂා මනාව පාලනය කර තබා ගැනීමට සහ උද්ධමනය ස්ථායීව තබා ගැනීමට උපකාරී වේ. එමගින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි විශ්වාසය ශක්තිමත් වේ. අනෙක් අතට, උද්ධමනකාරී අවදානම්වලට සහ ආර්ථික අස්ථාවරත්වයට හේතු වෙමින් දුර්වල වගවීමේ රාමුවක් මගින් විශ්වාසය අඩු විය හැකිය.

ඵලදායී වගවීමේ පියවර අතර පැහැදිලි අධීක්ෂණය, විනිවිදභාවය සහ කාර්යසාධන ඇගයීම ඇතුළත් වේ. ප්‍රතිඵල කෙරෙහි බලපාන බාහිර සාධක සමඟ, ආර්ථිකයේ ඉදිරි දැක්ම සහ මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා හේතු පිළිබඳ වාර්තා ප්‍රකාශයට පත් කිරීමට මහ බැංකුවලට නිරන්තරයෙන් අවශ්‍ය වේ. මහ බැංකුවල ඉහළ වගවීම හේතුවෙන් ඒවායේ පරිපාලන විධිවිධාන, ප්‍රතිපත්ති, මෙහෙයුම් සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ අන්තර්ක්‍රියා වැඩිදියුණු වේ. මේ සම්බන්ධයෙන් වූ පර්යේෂණවලින් පෙනී යන්නේ වගවීම සහ විනිවිදභාවයෙන් යුතු මහ බැංකු ඇති රටවල සාමාන්‍යයෙන් අඩු සහ ස්ථායී උද්ධමන අනුපාතික සහිතව වඩා හොඳ ආර්ථික කාර්යසාධනයක් පවත්වාගෙන ඇති බවයි (Mishkin, 1997). කෙසේ වෙතත්, අතිශයින් විමර්ශනශීලී වීමද ඇතැම් විට තීරණ ගැනීම මන්දගාමී වීමට හෝ අධික ලෙස ප්‍රවේශම් සහගත හැසිරීමකට හේතු විය හැකි අතර, එමගින් ආර්ථික අර්බුදවල දී මහ බැංකුවකට තීරණාත්මක නමුත් අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා බාධා ඇති කරයි (Goodhart, 2010).

මහ බැංකු ස්වාධීනත්වය සහ ඉහළ වගවීම එකිනෙක අතර සහජයෙන් ම බැඳී පවතී (Adrian and Khan, 2019). නිවැරදි මුදල් ප්‍රතිපත්තියක් සඳහා පදනම සපයන්නා වූ විනිවිදභාවය සහ වගවීම මහ බැංකුවේ ස්වාධීනත්වය සඳහා පූර්ව අවශ්‍යතා වේ. මහ බැංකු විසින් වාර්තා ප්‍රකාශයට පත් කිරීම හෝ නීතිමය ආයතන වෙත පැහැදිලි කිරීම් හරහා රජයට, මහජනතාවට සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදකයින්ට තම තීරණ පිළිබඳ තොරතුරු නිතිපතා සැපයීම තුළින් විනිවිදභාවය ඇතිවනු ඇත.

### උද්ධමන ඉලක්ක මග හැරීම්වල දී මහ බැංකු වගවීමේ වැදගත්කම

උද්ධමන ඉලක්කකරණය යනු මහ බැංකුවකට නිශ්චිත කාල සීමාවක් තුළ ළඟා කර ගත යුතු නිශ්චිත උද්ධමන ඉලක්කයක් ලබා දෙනු ලබන මුදල් ප්‍රතිපත්ති රාමුවකි. ප්‍රධාන වශයෙන් ම, සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික සකස් කිරීම හරහා, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් මහ බැංකු උද්ධමනය ඉලක්කගත මට්ටමක තබා ගැනීමට උත්සාහ කරන අතර, එමගින් අවිනිශ්චිතතා අඩු කර ආර්ථික උච්චාවචනයන් අවම කෙරේ. කෙසේ වෙතත්, මහ බැංකුවලට සෑම විටම එකඟ වූ ඉලක්කගත මට්ටම් තුළ උද්ධමනය පවත්වා ගැනීමට නොහැකි වේ. මෙය පරිපාලිත මිල සංශෝධන සහ දේශීය සාධකවලින් හෝ ගෝලීය වශයෙන් පැන නගින සැපයුම් අංශයෙහි අවහිරතා ඇතුළු විවිධ හේතු නිසා සිදු විය හැකිය. විශේෂයෙන් ම, උද්ධමනය එහි ඉලක්කයෙන් අපගමනය වන විට, මහජන විශ්වාසය වැඩි කිරීම සහ උද්ධමනය එහි ඉලක්කගත මට්ටමට නැවත ගෙන ඒම සඳහා ශක්තිමත් වගවීමක් අත්‍යවශ්‍ය වේ. මහ බැංකු විසින් අපගමනයට හේතු පැහැදිලි කළ යුතු මෙන්ම, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතු අතර, සිය ප්‍රතිපත්ති තීරණවල විනිවිදභාවය පවත්වා ගත යුතුය. මහ බැංකුවලට තම කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු කරමින් වෙනස්කම්වලට ඉක්මනින් හා කාර්යක්ෂමව අනුවර්තනය වීමට ඇති හැකියාව සහතික කරමින්, මෙම ක්‍රියාවන්ට මග පෙන්වීම සඳහා නීතිමය රාමු බොහෝ විට ක්‍රියාත්මක වේ (Adrian and Khan, 2019).

උද්ධමනය ඉලක්කගත මට්ටම්වලින් අපගමනය වීමට හේතු තේරුම් ගැනීම මහ බැංකු සහ රජයන්ට ස්ථාවරත්වය නැවත ලබා ගැනීම සඳහා වඩා හොඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට උපකාරී වේ. වෙනත් රටවල පෙර අත්දැකීම් සලකා බැලීමේ දී, තෙල් මිල ඉහළ යෑම, සැපයුම් දාම අවහිරතා සහ ගෝලීය අවිනිශ්චිතතා වැනි බාහිර කම්පන උද්ධමනය එහි ඉලක්කයෙන් අපගමනය වීම සඳහා වන පොදු හේතු සාධක වන නමුත්, එය දේශීය සාධක නිසා ද සිදුවිය හැකිය. උදාහරණයක් ලෙස, කැනඩා මහ බැංකුව 2008 වසරේ දී උද්ධමනය ඉහළ යෑමට ප්‍රධාන හේතුව ලෙස වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම සඳහන් කර ඇති අතර උද්ධමනය පාලනය කෙරෙහි ගෝලීය මූල්‍ය අර්බුදයේ බලපෑම් පිළිබඳව සඳහන් කර ඇත (Bank of Canada, 2008). ඒ හා සමානව, නවසීලන්ත සංචිත බැංකුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී අය කරනු ලබන බදු ඉහළ යෑම ඇතුළු සැපයුම් අංශයෙහි සාධක මගින් 2011 වසරේ දී උද්ධමනය ඉහළ යෑමට හේතු පැහැදිලි කළ අතර, භූමිකම්පාවකින් පසුව එය උද්ධමනය කෙරෙහි කෙසේ බලපානු ඇත්දැයි අපේක්ෂා කළ ආකාරය තවදුරටත් පැහැදිලි කළේය (Reserve Bank of New Zealand, 2011). චෙක් ජාතික බැංකුව වැනි ඇතැම් මහ බැංකු, සැලකිය යුතු ආර්ථික කම්පනවලට මුහුණ දෙන විට ඔවුන්ගේ විධිවිධානයන්ගෙන් තාවකාලිකව විතැන් වීමට පවා ඉඩ හරී (Rusnok, 2018). එපමණක් නොව, බොහෝ විට, සංවර්ධිත

ආර්ථිකයන්ට වඩා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි විශාල හා නිරන්තර සැපයුම් කම්පන ඇති වේ. එබැවින්, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි අදාළ ඉලක්කවලින් උද්ධමනය අපගමනය වීම් සඳහා සැපයුමට අදාළ සාධක බහුල වශයෙන් හේතු විය හැකිය.

උද්ධමනය ඉලක්කයට නැවත පැමිණීමේ වේගය ආර්ථික තත්ත්වය සහ ගනු ලබන ප්‍රතිපත්තිමය පියවරවල ඵලදායීතාවය මත රඳා පවතී. උදාහරණයක් ලෙස, පොලී අනුපාතිකවල වෙනස්කම් උද්ධමනයට බලපෑම් කිරීමට සාමාන්‍යයෙන් මාස 18ත් 24ත් අතර කාලයක් ගත වන බව පර්යේෂකයන් සොයාගෙන ඇත. රටක ආර්ථික හා මූල්‍ය වෙළඳපොළ තත්ත්වය අනුව මෙම කාලය මෙයට වඩා දිගු හෝ කෙටි විය හැකිය. විශේෂයෙන් සැපයුම් අංශයෙහි සාධක මගින් උද්ධමනය මෙහෙයවනු ලබන විට, ද්‍රවශීලතා කළමනාකරණය සහ ඉදිරි ප්‍රතිපත්ති මග පෙන්වීම වැනි අතිරේක මෙවලම් භාවිතා කිරීමට ද මහ බැංකු සූදානම් විය යුතුය. සැපයුම් අංශයෙහි සාධක විශේෂයෙන් සැලකූ විට ඇතැම් රජයේ ප්‍රතිපත්ති ද උද්ධමන කළමනාකරණයට සහාය වේ. බදු පැනවීම සහ පරිපාලන මිල ගණන් වැනි කෙටි කාලීන ප්‍රතිපත්ති මෙන්ම කාලගුණය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා වන දිගු කාලීන ප්‍රතිපත්ති ආහාර හා බලශක්ති උද්ධමනයේ තාවකාලික විචලනයන් පාලනය කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, සැපයුම් අංශයේ ගැටලු සාමාන්‍යයෙන් තාවකාලික වන අතර කාලයත් සමඟ ස්වභාවයෙන්ම නිවැරදි වන බව ද සැලකිල්ලට ගත යුතුය. අනෙක් අතට, උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම අඛණ්ඩව පවතින්නේ නම්, එවැනි අපගමන සඳහා හේතු කුමක් වුවත්, උද්ධමන අපේක්ෂා නැවත පාලනය කර ගැනීමට සහ හැකි ඉක්මනින් උද්ධමනය ඉලක්කගත මට්ටම් කරා ගෙන ඒමට මහ බැංකු කටයුතු කළ යුතුය. ඒ අනුව, විවිධ ආර්ථික පාර්ශ්වකරුවන් ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ දී මහ බැංකු සන්නිවේදනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

### 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ මුදල් ප්‍රතිපත්ති වගවීම සම්බන්ධව පවතින විධිවිධාන

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මහ බැංකුව සඳහා ඉහළ මුදල් ප්‍රතිපත්තිමය වගවීමක් මෙන්ම මෙහෙයුම් ස්වාධීනත්වයක් ද සපයයි. මහ බැංකු පනතෙහි 26 වන වගන්තියේ සඳහන් පරිදි මහ බැංකුව විසින් සපුරා ගත යුතු උද්ධමන ඉලක්කය පිළිබඳ මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමක් අත්සන් කළ යුතුය. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ කාර්තුමය සාමාන්‍ය උද්ධමනය අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා 5%ක උද්ධමන ඉලක්කයට ආසන්න ආන්තිකයක් (ප්‍රතිශතාංක ± 2) තුළ පවත්වා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව මහජනතාවට ද ලබා ගත හැකි විය යුතු අතර, අපගමනයට හේතු පැහැදිලි කිරීම, මහ බැංකුව විසින් ගත යුතු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ උද්ධමනය ඉලක්කගත පරාසයට නැවත ගෙන ඒම සඳහා ගත වන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් එහි ඇතුළත් විය යුතුය. තවද, මහ බැංකු පනතෙහි 27 වන වගන්තියට අනුව, උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා, උද්ධමනය සඳහා හේතු වූ සාධක සහ උද්ධමනය සඳහා මැදි කාලීන පුරෝකථන සහ එවැනි පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් පැහැදිලි කරමින්, මහ බැංකුව විසින් මාස හයකට වරක් වාර්තාවක් ප්‍රකාශයට පත් කළ යුතුය. ඊට අමතරව, මහ බැංකු පනතෙහි 80 වන වගන්තිය යටතේ, මහ බැංකුව අවම වශයෙන් සෑම මාස හයකට වරක්වත් සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳව මහජනතාව දැනුම්වත් කළ යුතුය. ඉහත 27 වන සහ 80 වන වගන්තිවල අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව, මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම් ස්වාධීනත්වය මහ බැංකුවට ලබා දෙන අතර ම, සිය ක්‍රියාවන් සහ මිල ස්ථායීතා අරමුණ සාක්ෂාත් කර ගැනීම පිළිබඳ වගවිය යුතු බැවින්, මහ බැංකු පනත ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

### මෑත කාලීනව උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම සහ වගවීමේ පියවර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම්

2024 වසරේ දෙවන, තෙවන සහ සිව්වන කාර්තුවල දී ශ්‍රී ලංකාවේ උද්ධමනය, ප්‍රධාන වශයෙන් විදුලිය සහ ඉන්ධන මිල අඩු කිරීම මෙන්ම ආහාර උද්ධමනය පහළ යෑම වැනි සැපයුම් අංශයෙහි සාධක හේතුවෙන් උද්ධමන ඉලක්කයට ප්‍රතිශතාංක දෙකකට වඩා පහළින් පැවතුණි. තවද, ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම ද උද්ධමනය පහළ යෑමට දායක විය. ඒ අනුව, මහ බැංකු පනතේ අවශ්‍යතාවය පරිදි, උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, ඒ සඳහා මහජනතාවට ප්‍රවේශය ලබා දීමටත් මහ බැංකුව කටයුතු කරන ලදී. 2024 වසරේ දෙවන සහ තෙවන කාර්තු සඳහා අදාළ වන එම පළමු වාර්තාව මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර, 2024 වසරේ තෙවන සහ සිව්වන කාර්තු සඳහා අදාළ වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර එය ඉදිරි කාලය තුළ මහජනතාවට ද ලබාගත හැකිවනු ඇත. තවද, ඉහත සඳහන් කළ සාධක ම හේතු වීමෙන් 2025 වසරේ පළමු කාර්තුව තුළ උද්ධමනය, එහි ඉලක්කයට වඩා ප්‍රතිශතාංක දෙකකට වඩා අඩු මට්ටමක පැවති බැවින්, මහ බැංකුව විසින් 2024 වසරේ සිව්වන කාර්තුවට සහ 2025 වසරේ පළමු කාර්තුවට ද අදාළ වන ඒ හා සමාන වාර්තාවක් ඉදිරිපත් කෙරෙනු ඇත. 2025 වසරේ මාර්තු මාසයේ සිට අවධමනකාරී තත්ත්වය ලිහිල් වීමට පටන් ගෙන ඇති බව නිරීක්ෂණය කරන අතර ම, පුරෝකථනයන්ට එළඹීමේ දී භාවිතා කරන ලද දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මගින් නිරූපණය වන ආර්ථික තත්ත්වයන්හි සැලකිය යුතු අපගමනයන් සිදුනොවේ නම්,

3

නවතම පුරෝකථනයන්ට අනුව, පවතින අවධමනය තාවකාලික වනු ඇති බවත්, 2025 වසරේ තෙවන කාර්තුව වන විට උද්ධමනය ඉලක්කයේ සිට ප්‍රතිශතාංක ± 2 තුළට නැවත පැමිණෙනු ඇති බවත් මහ බැංකුව අපේක්ෂා කරයි.

### උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීම සහ වගවීමේ පියවර සම්බන්ධයෙන් ගෝලීය අත්දැකීම්

උද්ධමන ඉලක්ක කඩවීම් සම්බන්ධයෙන් වන වගවීමේ පියවර පිළිබඳ උදාහරණ ලොව පුරා විවිධ මහ බැංකු අතර නිරීක්ෂණය කළ හැකිය. 1998 එංගලන්ත මහ බැංකු පනතේ නියම කර ඇති පරිදි, එංගලන්ත මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති කමිටුව සඳහා වන කාර්යභාරය අනුව, උද්ධමන ඉලක්කයේ සිට ඉහළට හෝ පහළට 1%කට වඩා උද්ධමනය වෙනස් වුවහොත්, අධිපතිවරයා විසින් භාණ්ඩාගාරයේ චාන්සලර්වරයා වෙත ලිපියක් යැවිය යුතුය. 2022 වසරේ දී රුසියානු-යුක්රේන ගැටුම සහ බලශක්ති මිල ඉහළ යෑම හේතුවෙන් එක්සත් රාජධානියේ උද්ධමනය 10% ඉක්මවා ගිය අතර, ඒ හේතුවෙන් අධිපතිවරයා සහ චාන්සලර්වරයා අතර සන්නිවේදන කිහිපයක් සිදු විය. ඒ හා සමානව, 2021 නවසීලන්ත සංචිත බැංකු පනත මගින් මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශන නිතිපතා ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වන අතර, මුදල් ප්‍රතිපත්ති කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි, උද්ධමන අපගමනයන් සඳහා හේතු පැහැදිලි කිරීම අවශ්‍ය වේ. 2022 වසරේ දී උද්ධමනය 7%ක් ඉක්මවා සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළ විට, නවසීලන්ත සංචිත බැංකුව විසින් උද්ධමන ප්‍රවණතා, ඉලක්කයෙන් අපගමනය වීම් සහ ප්‍රතිපත්ති ප්‍රතිචාර එහි මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශනවල පැහැදිලි කරන ලදී. 1934 ඉන්දියානු සංචිත බැංකු පනතට (2016 වසරේ සංශෝධිත) අනුව, උද්ධමනය අඛණ්ඩව කාර්තු තුනක් ඉලක්කගත පරාසයෙන් පිටත පැවතුනහොත්, මහ බැංකුව විසින් රජයට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ගෝලීය උද්ධමනය ඉහළ යෑමත් සමඟ 2022 වසරේ දී ඉන්දියාවේ උද්ධමනය, උද්ධමන ඉලක්කය ඉක්මවා ගියේය. මේ හේතුවෙන් ඉන්දීය සංචිත බැංකුව හේතු පැහැදිලි කරමින් සහ නිවැරදි කිරීමේ පියවර ගෙන හැර දක්වමින් රජයට වාර්තාවක් ඉදිරිපත් කළේය. උද්ධමන කඩවීම් සඳහා හේතු දැක්වීම නීත්‍යානුකූලව අවශ්‍ය නොවුවත්, ෆෙඩරල් සංචිත බැංකුව එහි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳව කොංග්‍රසයට නිතිපතා වාර්තා කරයි. මෙවන් වගවීමේ පියවර විනිවිදභාවය සහතික කිරීම සඳහා පමණක් නොව, උද්ධමනය පාලනය කිරීමට මහ බැංකු මගින් ගනු ලබන ප්‍රයත්න කෙරෙහි විශ්වාසය ද ඉහළ නංවයි.

### සමාප්ති සටහන්

මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී වගවීම අත්‍යවශ්‍ය වේ. උද්ධමනය සඳහා පැහැදිලි ඉලක්ක ස්ථාපිත කිරීම, අපගමන පිළිබඳ පැහැදිලි කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මගින්, මහ බැංකුවලට සිය විශ්වසනීයත්වය ඉහළ නැංවීම හරහා මිල ස්ථායීතාව පවත්වා ගැනීමටත්, ආර්ථික වර්ධනයට සහාය වීමටත් හැකිය. බාහිර කම්පන හෝ අභ්‍යන්තර වැරදි ප්‍රතිපත්ති යන කවරක් සමඟ කටයුතු කිරීමට සිදු වුවත්, මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සහතික කිරීම සඳහා මහ බැංකු විනිවිදභාවයෙන් හා ප්‍රතිචාරශීලීව කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකාවේ මැදි කාලීන උද්ධමන අපේක්ෂා 5%ක ඉලක්කය සමඟ බොහෝ දුරට අනුකූල වන අතර, එය මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි ආර්ථික පාර්ශ්වකරුවන් අතර ඇති විශ්වාසය පිළිබිඹු කරයි. අර්ධ වාර්ෂික මුදල් ප්‍රතිපත්ති වාර්තා ප්‍රකාශයට පත් කිරීම වැනි සන්නිවේදන උපාය මාර්ග සහ මහ බැංකු පනතෙහි ඇති වගවීමේ ක්‍රියාමාර්ග එවැනි මහජන විශ්වාසයක් ඇති කිරීම සඳහා බෙහෙවින් සහාය වී ඇත.

**මූලාශ්‍ර**

1. Adrian, T. and Khan, A. (2019) 'Central Bank Accountability, Independence, and Transparency', *IMF Blog*, 25 November. Available at: https://meetings.imf.org/en/IMF/Home/Blogs (Accessed 30 March 2025).
2. Bank of Canada. (2008) *Monetary Policy Report Summary - October 2008.*
3. Goodhart, C.A.E. (2010) 'The Changing Role of Central Banks', *BIS Working Papers No. 326*, Bank for International Settlments.
4. Mishkin, F.S. (1997) 'Strategies for Controlling Inflation', In Lowe, P. (ed.), *Monetary Policy and Inflation Targeting, 21-22 July 1997, Kirribilli*. Sydney: Reserve Bank of Australia, pp. 7-38.
5. Reserve Bank of New Zealand. (2011) *Monetary Policy Statement - March 2011*.
6. Rusnok, J. (2018) 'Two Decades of Inflation Targeting in the Czech Republic', *Finance a Uver*, 68(6), pp.514-517.

නම්‍යශීලී විනිමය අනුපාතිකයක් ආර්ථිකයේ කම්පන අවශෝෂකයක් ලෙස ක්‍රියා කරන අතර අවසානයේ ගෙවුම් තුලනයේ ගැළපීම් හරහා විදේශීය අංශයේ ස්ථාවරත්වය සුරක්ෂිත කරයි. විනිමය අනුපාතිකය පෙර තීරණය කළ මට්ටමක පවත්වා ගැනීමේ අවශ්‍යතාවයකට සීමා නොවී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි ස්වාධීනත්වයක් ද මහ බැංකුවට එමගින් සැපයේ. විදේශ විනිමය වෙළඳපොළ ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය (FX Global Code) සම්මත කරගැනීම මගින් වෙළඳපොළ විශ්වසනීයත්වය වැඩි දියුණු වී වෙළඳපොළ භාවිතයන් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල කරන ලද අතර, 2025 වසරේ මාර්තු මාසය වන විට විදේශ විනිමය ගනුදෙනු ගැළපුම් වේදිකාව (FX matching platform) ක්‍රියාත්මක කිරීම මගින් වෙළඳපොළ පුළුල් බව සහ විනිවිදභාවය වැඩිදියුණු වී, මහ බැංකුවේ නියාමන අධීක්ෂණය ශක්තිමත් කෙරුණි. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි මිල අනාවරණ ක්‍රියාවලියට හිතකර ප්‍රතිපත්තියක් සහ මෙහෙයුම් රාමුවක් මගින් විනිමය අනුපාතිකය බොහෝ දුරට වෙළඳපොළ මූලිකාංග පිළිබිඹු

කරන බවත්, වෙළඳපොළ විශ්වාසනීයත්වය වර්ධනය කිරීම සහ පුළුල් සහ ද්‍රවශීලී වෙළඳපොළක් ඇති කිරීමට සහාය ලබා දෙන බවත් සහතික කරයි.

## 3.3 විදේශීය අංශයේ ප්‍රතිපත්ති

### විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග

**2024 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්ව ක්‍රමයෙන් වැඩිදියුණු වීම සහ විදේශීය අංශයේ දක්නට ලැබුණු ඉහළ ස්ථාවරත්වයට අනුකූලව, රජය විසින් මහ බැංකුව සමඟ සාකච්ඡා කර, වසංගතය සහ ආර්ථික අර්බුදය අතරතුර පනවන ලද පරිපාලන ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ලිහිල් කිරීමට කටයුතු කරන ලදී.** එවැනි ක්‍රියාමාර්ග අතරට ආනයන සීමා ලිහිල් කිරීම්, විදේශ විනිමය සීමා ලිහිල් කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ඇතුළත් වේ. මෙම පසුබිම තුළ, මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ජංගම ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීමට පනවා තිබූ ඇතැම් සීමාවන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය නියෝග සහ විධාන නිකුත් කරන ලදී. ඒ අනුව, ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම මගින්, අනේවාසිකයින් වෙත, ලැයිස්තුගත ණය සුරැකුම්පත්වල හෝ ලැයිස්තුගත කොටස්වල (නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් නාමනය කරන ලද) යම් ආදායමක් හෝ කල්පිරීමේ දී ලද ප්‍රතිලාභ ගෙවීමට සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම සඳහා ලබාගත් ණය ආපසු ගෙවීමට නේවාසික සමාගම්වලට අවසර දෙන ලදී. තවද, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් දරන නේවාසික සමාගම් විසින් ලබා ගන්නා ලද දැනට පවතින කෙටි කාලීන ණය, ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම මගින් අනේවාසිකයින්ට ගෙවීමට ද නේවාසිකයන්ට අවසර දෙන ලදී. තවද, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි, අවසර ලත් අඩු කිරීම්වලින් පසු ඉතිරි අපනයන ආදායම සඳහා අනිවාර්ය පරිවර්තන අවශ්‍යතාවය සඳහා වන කාල සීමාව, ලැබුණු දිනයේ සිට දිනදර්ශිත මාස තුනක් කල් ඉකුත් වීමෙන් පසු මාසයේ 10වන දින දක්වා දීර්ඝ කරන ලද අතර, එමගින් අපනයනකරුවන්ට වඩා දිගු කාලයක් විදේශ විනිමය රඳවා ගැනීම මගින් වඩා හොඳ මුදල් ප්‍රවාහ කළමනාකරණයක් සඳහා සහ විනිමය පරිවර්තන අලාභ අවම කර ගැනීමට ඉඩ සැලසේ. තවද, මෙරටින් සිදු කරන ලද අපනයන සහ රටට ආපසු එවන ලද අපනයන ආදායම සංසන්දනය කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතිය වැඩිදියුණු කරන ලදී.

**ගෙවුම් තුලන තත්ත්වයෙහි සිදු වූ වර්ධනයන් සමඟ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ලෙස ප්‍රාග්ධන ගනුදෙනු මත පනවා තිබූ ඇතැම් අත්හිටුවීම් සහ සීමා කිරීම් 2024 වසරේ දී ක්‍රමයෙන් ලිහිල් කරන ලදී.** ඒ අනුව, ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් විදේශීය ආයෝජන සිදු කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (Outward Investment Accounts) හරහා කරන ලද ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම සහ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු වෙනුවෙන් කරනු ලබන ප්‍රේෂණ ගෙවීම්වලට පනවා තිබූ තාවකාලික සීමාවන් 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස ලිහිල් කරන ලද අතර, එමගින් දේශීය ව්‍යාපාර සඳහා ගෝලීයව ව්‍යාප්ත වීමට ඇති අවශ්‍යතාවලට ප්‍රමුඛතාවය දෙන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ නේවාසිකයන් සතුව ඇති පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු වෙනුවෙන් කෙරෙන ප්‍රේෂණ ගෙවීම්වලට පනවා ඇති තාවකාලික සීමාවන් දිගටම පවතී. මීට අමතරව, සංක්‍රමණ දීමනාව යටතේ සංක්‍රමණිකයින් විසින් සිදු කරන අරමුදල් ගෙවීම් මත පනවා තිබූ සීමාවන් තවදුරටත් ලිහිල් කරන ලදී. තවද, තාවකාලික විදේශීය නේවාසික වීසා බලපත්‍රලාභී ශ්‍රී ලාංකිකයන්ට ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් මාරු කිරීම සඳහා ලබා දෙන දීමනාව 2021 වසරේ පෙබරවාරි මාසයේ දී නිකුත් කරන ලද විදේශ විනිමය රෙගුලාසිවල නියම කර ඇති සීමාවට නැවත ප්‍රතිස්ථාපනය කරන ලදී. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සිදු වන වර්ධනයන් සහ ගෙවුම් තුලන තත්ත්වවලට අනුකූලව විදේශ විනිමය පනත යටතේ දැනට ක්‍රියාත්මක කෙරෙන ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව ඉවත් කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

**විදේශ විනිමය ලැබීම් තවදුරටත් දිරිමත් කිරීම සඳහා 2024 වසරේ දී මහ බැංකුව ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් හඳුන්වා දුන්නේය.** ඒ අනුව, කොළඹ කොටස් වෙළඳපොළෙහි මුලපිරීමක් වන සුරැකුම්පත් සමපේක්ෂණ විකුණුම් සඳහා ඉඩ සැලසීමේ අරමුණින් 'සුරැකුම්පත් ණයට ගැනීම සහ ණයට දීමේ ගනුදෙනු' යටතේ ලැයිස්තුගත කර ඇති ඕනෑම සුරැකුම්පතක් අත්පත් කර ගැනීමට, රඳවා ගැනීමට, විකිණීමට හෝ ඇපයට තැබීමට අනේවාසිකයින්ට ඉඩ සැලසෙන පරිදි, විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ නව රෙගුලාසි හඳුන්වා දෙන ලදී. එයට අමතරව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වීසා වැඩසටහන් යටතේ නේවාසික වීසා ලබා ගන්නා විදේශිකයින්ගේ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ විධාන නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, නේවාසික සමාගම්වලට අනේවාසිකයන්ගෙන් ලබාගත් ණයවලින් ලැබෙන මුදල් භාවිතා කරමින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීමට ඇති අවසරය වසර තුළ දී අවලංගු කරන ලදී.

3

### ආනයන සීමා ලිහිල් කිරීම

**මහ බැංකුවේ නිර්දේශය මත, 2024 සහ 2025 වසරේ මුල් භාගයේ දී රජය විසින් ආනයන සඳහා පනවා තිබූ බොහෝ සීමාකාරී පියවර ලිහිල් කරන ලදී.** 2025 වන විට මෝටර් රථ ආනයනය සම්පූර්ණයෙන් ම ලිහිල් කිරීම සඳහා මහ බැංකුවේ නිර්දේශයන්ට අනුකූලව රජය මූලික ඉදිරි දැක්මක් සකස් කළේය. එවැනි ලිහිල් කිරීම්වලට මුහුණදීම සඳහා විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතීම සැලකිල්ලට ගනිමින්, ජා.මු. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වන අවශ්‍යතා සපුරාලීමේ අරමුණෙන් මෙය සිදු කරන ලදී. වාහන ආනයන සීමා ඉවත් කිරීම, 2024 වසරේ තුන්වන කාර්තුවේ දී පළමු අදියර ලෙස පොදු මගී ප්‍රවාහන හා විශේෂ කාර්යයන් සඳහා වන වාහන සහ මෝටර් රථ නොවන කාණ්ඩයේ භාණ්ඩ ආනයනයට අවසර දීමෙන් ආරම්භ කර, ඉන් අනතුරුව 2024 වසරේ සිව්වන කාර්තුවේ දී වාණිජ හෝ භාණ්ඩ ප්‍රවාහන වාහන සඳහා ද, 2025 වසරේ පළමු කාර්තුවේ දී පුද්ගලික පරිහරණය පිණිස මෝටර් රථ ආනයනය සඳහා ද අවසර ලබා දීම ලෙස අදියර තුනකින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී අදියර අනුව මෝටර් වාහන ආනයන සීමා ලිහිල් කිරීමේ සැලැස්ම අනුමත කරන ලදී. අදියර 1 යටතේ ලිහිල් කිරීම්, ප්‍රමාදයක් සහිතව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ආරම්භ කරන ලද අතර, 2025 වසරේ ජනවාරි මාසයේ දී අදියර 2 සහ අදියර 3 ක්‍රියාත්මක කරන ලදී. එක් එක් ලිහිල් කිරීමේ අදියරට සම්බන්ධ අවදානම් ඉස්මතු කරමින් මහ බැංකුව සිය නිරීක්ෂණ සහ නිර්දේශ රජයට ඉදිරිපත් කළේය. මෝටර් රථ ආනයනය වසර 5කට ආසන්න කාලයක් සීමා කර තිබීම හේතුවෙන්, ආනයනය නොකළ අවදියේ දී අධික ලෙස වර්ධනය වී ඇති මෝටර් රථ සඳහා වන ඉල්ලුම සීමා කිරීම සඳහා, මහ බැංකුවේ නිර්දේශයන්ට අනුකූලව, රජය විසින් සුදුසු බදු සහ බදු නොවන ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම සීමාකාරී පියවර තිබුණ ද, මෝටර් රථ ආනයනය හේතුවෙන් ආනයන වියදම්වල සැලකිය යුතු වැඩිවීමක් අපේක්ෂා කරන අතර එමගින් වෙළඳ හිඟය පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මෝටර් රථ ආනයනය මගින් ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය වනු ඇතැයි (ප්‍රධාන වශයෙන් වාණිජ කටයුතු සඳහා යොදාගන්නා වාහන හරහා) අපේක්ෂා කරන අතර, රජයේ ආදායම ද වැඩි වනු ඇත.

## 3.4 මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති

### සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති

**ඇති විය හැකි පද්ධතිමය අවදානම් හඳුනා ගැනීම, මූල්‍ය ස්ථායීතාව ශක්තිමත් කිරීම සහ අවශ්‍ය සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව විසින් සාර්ව විචක්ෂණතා ආවේක්ෂණය අඛණ්ඩව සිදු කරන ලදී.** ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 63(2) වගන්තියට අනුකූලව, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සහ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීමෙහිලා සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තියේ වැදගත් කාර්යභාරය ඉස්මතු කිරීම සඳහා මහ බැංකුව විසින් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුව මෙම වසර තුළ දී ප්‍රකාශයට පත් කරන ලදී. මෙම රාමුව මගින් සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තිවල ප්‍රධාන අරමුණු, පද්ධතිමය අවදානම් ආවේක්ෂණය, ප්‍රතිපත්ති මෙවලම් සහ මහ බැංකුවේ අනෙකුත් ප්‍රධාන ප්‍රතිපත්ති සමඟ සාර්ව විචක්ෂණතා ක්‍රියාමාර්ග ඒකාබද්ධ කිරීම පිළිබඳ තොරතුරු දක්වා ඇත. තවද, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු (Domestic Systemically Important Banks) නම් කිරීම සහ එම බැංකු සඳහා වන ස්වාරක්ෂකවල ප්‍රමාණයන් නිශ්චය කිරීම සඳහා පැවති රාමුව, බැංකු පද්ධතියෙහි වත්මන් වර්ධනයන් පිළිබිඹු වන පරිදි සමාලෝචනය කරන ලදී. පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකුවල සංශෝධිත ලැයිස්තුව ඉදිරියේ දී ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

**ආර්ථිකය යථා තත්ත්වයට පත් වී ස්ථාවර වීමත් සමඟ, මහ බැංකුව විසින් බැංකු අංශයේ ණය සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම සඳහා, විශේෂයෙන් රාජ්‍ය සංස්ථා සම්බන්ධ විශාල ගනුදෙනු නිරාවරණයන් (Large Exposure) සඳහා දැඩි සීමාවන් හඳුන්වා දෙන ලදී.** මෙමගින්, බාසල් (Basel) අවශ්‍යතාවලට අනුකූලව දැඩි විචක්ෂණ සීමාවන් සහ ණය ගනුදෙනුකරුවන් අතර අන්තර් සම්බන්ධතාවය තීරණය කිරීම සඳහා වන පාලන සම්බන්ධතාවය (Control Relationship) සහ ආර්ථික අන්තර් රැඳියාව (Economic Interdependence) ආවරණය කරන ශක්තිමත් නිර්ණායක ඇතුළත් කරන ලද අතර, බැංකු අංශයේ ණය සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම, සුරක්ෂිතතාව සහ ශක්තිමත් බව සහතික කිරීම මෙන්ම බැංකු අංශය කෙරෙහි පවත්නා මහජන විශ්වාසය ආරක්ෂා කිරීම ද අපේක්ෂිතය. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු සඳහා ඔවුන්ගේ විශාල ගනුදෙනු නිරාවරණ ප්‍රමාණය, සිය පළමු ස්ථර (Tier I) ප්‍රාග්ධනයෙන් 25%ක් දක්වා සීමා කරමින් 2026 වසරේ ජනවාරි 1 සිට බලාත්මක වන පරිදි 2024 වසරේ මාර්තු මාසයේ දී බලපත්‍රලාභී බැංකු වෙත විධානයක් නිකුත් කරන ලදී. 2024 අංක 01 දරන විධානය යටතේ, මෙම සීමාවන් තනි සමාගම්, රාජ්‍ය සංස්ථා, ආයතන, පුද්ගල සංගම් සහ තනි පුද්ගලයින් ඇතුළු ණය ගනුදෙනුකරුවන්ට තනි පදනමක් මත මෙන්ම සම්බන්ධිත ණය ගැතියන් සඳහා සමස්ත පදනමින් ද අදාළ වේ. මෙම නියාමනය, 2026 ජනවාරි 1 වන දින සිට ස්වාධීන පදනමින් (Standalone Basis) සහ 2030 ජනවාරි 1 වන දින සිට ඒකාබද්ධ පදනමින් (Consolidated Basis) ක්‍රියාත්මක වේ. පවත්නා සාර්වමූල්‍ය තත්ත්වයන් සහ ආර්ථිකය යළි නගා සිටු වීම සඳහා සහාය වීමේ අඛණ්ඩ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, මෙම නිරාවරණ

සීමාවන්, වසර තුනක කාලයක් තුළ ක්‍රමිකව ක්‍රියාත්මක කරනු ලබන අතර 2028 වසර වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කෙරේ. බලපත්‍රලාභී බැංකු රාජ්‍ය සංස්ථා වෙත සමස්ත නිරාවරණ සම්බන්ධයෙන් පැනවෙන උපරිම නිරාවරණ සීමාව සපුරාලීම සඳහා 2030 වසර වන විට රාජ්‍ය සංස්ථා වෙත පවත්නා නිරාවරණ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු කළ යුතුය. මෙම ප්‍රවේශය මගින්, පවතින තත්ත්වයේ සිට වඩා යහපත් තත්ත්වයක් වෙත සුමටව සංක්‍රමණය වීම සඳහා පහසුකම් සලසනු ලබන අතර මූල්‍ය ස්ථායීතාව පවත්වා ගනිමින් ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා ද ඉඩ සැලසේ. සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ වැඩිදුර විස්තර, 2024 මූල්‍ය ස්ථායීතා සමාලෝචනයෙන් ලබා ගත හැකිය.[6]

## බලපත්‍රලාභී බැංකුවලට අදාළ ප්‍රතිපත්ති

**බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා රෙගුලාසි නිකුත් කිරීම සහ අධීක්ෂණ ප්‍රවේශය ශක්තිමත් කිරීම ඇතුළු විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හඳුන්වා දීමට, මහ බැංකුව 2024 වසර තුළ දී නොකඩවා කටයුතු කළේය.** 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීම, බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ නෛතික රාමුව ශක්තිමත් කිරීමෙහිලා වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. එය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින්, මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නව රෙගුලාසි/මාර්ගෝපදේශ කිහිපයක් වසර තුළ දී නිකුත් කරන ලදී. ඒ අනුව, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යාම අත්හිටුවමින්, බලපත්‍රලාභී බැංකු සඳහා ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත ලෙස ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය පවත්වා ගත යුතු බව නිර්ණය කරමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කෙරිණි. ඊට අමතරව, බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ව්‍යාපාර පිළිබඳ වන බැංකු පනත් විධානය සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සඳහා භාවිතා වන විදේශ ව්‍යවහාර මුදල් නම් කරමින් බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු) නියෝගය යනාදී රෙගුලාසි කිහිපයක් ද නිකුත් කළේය. තවද, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය ඇගයීම පිළිබඳ බැංකු පනත් නිර්ණ සහ විධාන ද නිකුත් කෙරිණි. තවදුරටත්, බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන් (Related Parties) නිශ්චිතව දක්වමින්, එවැනි සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන්, අනුමත සුරැකුම් සහ ඊට අදාළ සීමාවන් නිශ්චය කරමින් රෙගුලාසි නිකුත් කළේය.

6 https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/fssr/fsr_2024e.pdf

**වර්තමාන වෙළඳපොළ වර්ධනයන්, ගෝලීය ප්‍රශස්ත භාවිතයන් සහ යාවත්කාලීන වන නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව බලපත්‍රලාභී බැංකුවල ආයතනික යහපාලන රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී.** සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීම ඇතුළුව අවදානම් අධීක්ෂණ හා පාලන උපක්‍රමයන් වැඩිදියුණු කරන අතර ම බැංකුවල ආයතනික යහපාලන ක්‍රියාවලීන් සහ එහි භාවිතයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ නිපුණතාවය සහ වෘත්තීමය අවංකභාවය අවධාරණය කිරීම ප්‍රධාන වශයෙන් අරමුණු කර ගනිමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

**වත්කම් හානිය ඉහළ යාම විචක්ෂණශීලී ලෙස කළමනාකරණය, ණය අවදානම අවම කිරීම සහ සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර තිරසර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකු තුළ ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" යන චක්‍රලේඛය නිකුත් කරන ලදී.** තවද, ජාතික ණය සුරැකුම් ආයතනය දක්වන ලද මූල්‍ය ආයතන ලැයිස්තුවට ඇතුළත් කරමින් සහ එම ආයතනය විසින් ඇපවන නිරාවරණ ප්‍රමාණය සඳහා අවදානම මත බර තැබීමේදී සහනදායී අනුපාතයක් ලබා දෙමින් බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පිළිබඳ වන බැංකු පනත් විධාන සංශෝධනය කරන ලදී. මහ බැංකුව විසින් ආර්ථික අංශවලට සහාය වීම සඳහා සිය ප්‍රයත්නයන් අඛණ්ඩව සිදු කරන අතර පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීන අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහන සැලසීමේ ක්‍රියාමාර්ග දක්වමින් ඒ පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

**තවද, බැංකු පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් කලින් කලට නියාමන ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වා දී ඇත.** බලපත්‍රලාභී බැංකුවල කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රකාශන ආකෘති නියම කිරීම, තෝරාගත් බලපත්‍රලාභී බැංකුවල අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව තීරණය කිරීම පිළිබඳ බැංකු පනත් නිර්ණයක් නිකුත් කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ජංගම බැංකු ඒකක පිහිටුවීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම යනාදිය මෙම නියාමන ක්‍රියාමාර්ග අතර වේ.

## මුදල් සමාගම්වලට අදාළ ප්‍රතිපත්ති

**මුදල් සමාගම් තුළ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් ණය අවදානම් සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා විධාන දෙකක් නිකුත් කරන ලදී.** මෙම රාමු මගින්, අවදානම් කළමනාකරණ

ක්‍රමෝපායයන්, ප්‍රතිපත්ති හා ක්‍රියාවලි, පාලන ව්‍යුහයන් සහ අංශයට ඇතිවිය හැකි අවදානම් කළමනාකරණය සඳහා වන පද්ධති ඇතුළු තීරණාත්මක අංශ ආවරණය කරයි. තවද, දත්තවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා "කාලාවර්තක වාර්තා කිරීමේ අවශ්‍යතා" පිළිබඳ විධානයක් නිකුත් කිරීම මගින් මුදල් සමාගම් විසින් කාලීන, නිරවද්‍ය, අඛණ්ඩ සහ පූර්ණ තොරතුරු වාර්තා කිරීම සහතික කරන ලදී.

**මූල්‍ය ස්ථායීතාව වැඩි දියුණු කිරීමේ සහ සාධාරණ වෙළඳපොළ පිළිවෙත් සහතික කිරීමේ අරමුණින්, මුදල් සමාගම්වල තැන්පතු කැඳවීමේ පිළිවෙත් සහ වේතන ප්‍රතිපත්තිවලට අදාළව ප්‍රධාන නියාමන පියවර ක්‍රියාත්මක කරන ලදී.** "මූල්‍ය සමාගම් විසින් තැන්පතු කැඳවීම" පිළිබඳ විධානයේ දක්වා ඇති පරිදි, තැන්පතු භාරගැනීම, වෙළඳ දැන්වීම් පළකිරීම සහ තැන්පතු දිරිගැන්වීමේ යෝජනාක්‍රම ඉදිරිපත් කිරීමට අදාළ කොන්දේසි සඳහා වන සුවිශේෂී පිළියම් තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමට සහ මුදල් සමාගම් අතර සාධාරණ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. තවද වසර තුළ දී, "වැටුප් ප්‍රතිපත්ති සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ" නිකුත් කිරීම මගින් මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා වැටුප් ලබා දීමේ දී ස්ථාවර බව, සාධාරණත්වය සහ විනිවිදභාවය සහතික කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**බැංකු නොවන මූල්‍ය ආයතන (Non-Bank Financial Institutions) ඒකාබද්ධකරණ සැලැස්මෙහි පළමු අදියර සාර්ථකව නිම කිරීම සහ දෙවන අදියර හඳුන්වාදීමත්, ඒ හා සමගාමීව නියාමන අවශ්‍යතා සමඟ අනුකූල නොවීම් සහ මූල්‍ය ස්ථායීතා ගැටලු සඳහා පිළියම් යෙදීම මගින්, බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණය හා අධීක්ෂණය සාර්ථක ප්‍රගතියක් ලබා ගන්නා ලදී.** 2020 වසරේ දී ආරම්භ කරන ලද බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණ සැලැස්මෙහි පළමු අදියර, එහි දක්වා ඇති අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගනිමින් අවසන් කරන ලද අතර ඒකාබද්ධකරණ සැලැස්මෙහි සංශෝධිත දෙවන අදියර වසර තුනක ක්‍රියාත්මක කිරීමේ කාල සීමාවක් සහිතව 2024 දෙසැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව අනුව, ප්‍රාග්ධනය හා සම්බන්ධ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල නොවන මුදල් සමාගම්වලට සහ අනෙකුත් නියාමන අවශ්‍යතා සමඟ අනුකූල නොවන මුදල් සමාගම්වලට එරෙහිව නියාමන ක්‍රියාමාර්ග වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. ඇතැම් මුදල් සමාගම් විසින් අදාළ නියාමන විධාන සමඟ අනුකූලතාවය තහවුරු කිරීමෙන් පසු, එම සමාගම්වල තැන්පතු සහ ණය මත පනවා තිබූ සීමාවන් ඉවත් කරන ලදී. තවද, බිඳවැටුණු මුදල් සමාගම් සඳහා වූ නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලද අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා එම සමාගම්වල ඈවරකරුවන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

## රාජ්‍ය ණය කළමනාකරණ ප්‍රතිපත්ති

**2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීම රාජ්‍ය ණය කළමනාකරණයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය.** එම පනත 2024 වසරේ ජුනි 18 වන දින නීතිගත කරන ලද අතර, මුදල් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනයක් හරහා 2024 වසරේ නොවැම්බර් 25 වන දින සිට බලාත්මක කරනු ලැබූ එම පනතේ විධිවිධානවලට අනුකූලව, 2024 වසරේ දෙසැම්බර් 2 වන දින මුදල් අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වගන්තියට අනුකූලව, රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය හෝ කාර්යාලයට අදාළ නීතිය බලාත්මක වන තෙක් මහ බැංකුව විසින් රජය වෙනුවෙන් රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම සහ රාජ්‍ය ණය කළමනාකරණය අඛණ්ඩව සිදු කරනු ඇත. එමෙන්ම, රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 37 වන වගන්තියට අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීමට මාස 18ක කාලයක් ලබා දෙමින්, අමාත්‍යවරයා විසින් පත් කරන ලද දින සිට මාස 18ක කාලයක් ඇතුළත, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝගයක් මගින් ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වන වගන්තියට අදාළ වීම ක්‍රියාත්මක විය යුතුය. මේ අනුව, අදාළ නීති මගින් අර්ථ දක්වා ඇති පරිදි රාජ්‍ය ණය කළමනාකරණ පනතේ පත් කළ දින එනම්, 2024 නොවැම්බර් 25 වන දින සිට උපරිම වශයෙන් මාස 18ක්, මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එහි කාර්යයන් ඉටු කිරීම සිදු කළ යුතුය.

## මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ප්‍රතිපත්ති

**මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ, ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රමුඛතාවක් ලෙස ඉස්මතු වී ඇති අතර, එය වඩාත් සාධාරණ හා තිරසර මූල්‍ය පරිසරයක් සඳහා වන ප්‍රමුඛතාවයට අනුකූලව සිදු කෙරේ.** 2021 වසරේ දී ආරම්භ කරන ලද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි ක්‍රියාකාරී සැලැස්ම, එහි පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිව තවදුරටත් සාර්ථකව ක්‍රියාත්මක විය. මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය, 2024 වසරේ මැයි මාසයේ දී එළිදක්වන ලද අතර එය මූල්‍යමය සාක්ෂරතාවයෙන් සහ හැකියාවෙන් යුත් සමාජයක් ඇති කිරීම අරමුණු කරයි.

**2023 වසරේ දී පිහිටුවන ලද ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යමින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම අත්හිටුවීම 2024 වසරේ දී ද ක්‍රියාත්මක විය.** මෙය, මහ බැංකුවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ණය ලබාදීමේ ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව අවම කිරීමේ උපාය මාර්ගික අභිප්‍රාය ඇතිව, රජය සහ

පරිත්‍යාගශීලී ආයතන විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම අත්හිටුවීමට මහ බැංකුවේ පාලක මණ්ඩලය ගත් තීරණයට අනුකූල වේ. එසේ වුවද, රජය විසින් මෙහෙයවනු ලබන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන්හි ක්‍රියාකාරී භූමිකාවක් මහ බැංකුව විසින් ඉටු කරනු ලබයි.

## ගෙවීම් සහ පියවීම් පද්ධති සඳහා වන ප්‍රතිපත්ති

**ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ ස්ථායීතාව සුරක්ෂිත කරමින් ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් මහ බැංකුව විසින් මෙම වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී.** මෙම ප්‍රයත්නයන්හි කොටසක් ලෙස අන්තර්ජාතික ප්‍රමිතීන්වලට අනුකූලව ඉහළ වටිනාකමින් යුතු දේශීය ගෙවීම් සඳහා ISO 20022 ප්‍රමිතීන් ක්‍රියාත්මක කරන ලදී. සුළු පරිමාණ ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව LANKAQR ගනුදෙනු සඳහා වූ උපරිම වෙළඳ වට්ටම් අනුපාතය (Merchant Discount Rate - MDR) ගනුදෙනු මුදලින් 1% ක් ලෙස නැවත ස්ථාපිත කළ අතර, ගනුදෙනුවක උපරිම සීමාව රුපියල් 200,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කරන ලදී.

**රාජ්‍ය ආයතනවලට සිදු කරන මාර්ගගත ගෙවීම් සක්‍රිය කිරීමට සහ ඒවායේ කාර්යක්ෂමතාව මෙන්ම මහජනතාවට එම මාර්ගගත ගෙවීම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ද වැඩි දියුණු කිරීමේ අරමුණින්, සියලුම බලපත්‍රලාභී බැංකුවලට ඔවුන්ගේ අන්තර්ජාල බැංකුකරණ පද්ධති සහ ජංගම ගෙවීම් යෙදුම් හරහා තම ගනුදෙනුකරුවන්ට GovPay පහසුකම ලබා දෙන ලෙස මහ බැංකුව උපදෙස් ලබා දුන්නේය.** දැනට තමන්ගේම අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතියක් නොමැති, විශේෂයෙන් පළාත් පාලන මට්ටමේ රාජ්‍ය ආයතනවලට මහජනතාවගෙන් ඩිජිටල් ගෙවීම් භාරගැනීමට GovPay මගින් හැකියාව ලබා දෙයි.

**ඩිජිටල් ගෙවීම්වල ආරක්ෂාව ශක්තිමත් කිරීම, ඩිජිටල් ගනුදෙනුවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ ඩිජිටල් ගෙවීම් ක්‍රම කෙරෙහි පාරිභෝගික විශ්වාසය වැඩි කිරීම සඳහා මහ බැංකුව විසින් පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** ජස්ට්පේ (JustPay) පහසුකම සක්‍රිය කර ඇති සියලුම ජංගම යෙදුම් හරහා සිදු කරනු ලබන රුපියල් 10,000 හෝ ඊට වැඩි ගනුදෙනු සඳහා එක් වරක් පමණක් භාවිත කළ හැකි මුරපදයක් (OTP) ඉල්ලා සිටීම අනිවාර්ය කිරීම මගින් ඩිජිටල් ගෙවීම් තවදුරටත් ශක්තිමත් කරන ලදී. ජංගම ගෙවීම් යෙදුම් සමඟ සම්බන්ධ කර ඇති ගනුදෙනුකරුවන්ගේ ජංගම ගිණුම් හෝ ඉතිරි කිරීමේ ගිණුම් (Current Accounts/Savings Accounts) අනවසර ප්‍රවේශයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා, ජංගම ගෙවීම් යෙදුම් සඳහා ලියාපදිංචි කිරීමේ දී පරිශීලක තොරතුරු සත්‍යාපනය කිරීමෙන් පාරිභෝගිකයා හඳුනාගැනීමේ හැකියාව වැඩි දියුණු කරන ලෙස මහ බැංකුව, ජංගම ගෙවීම් යෙදුම් සපයන්නන් (Mobile Payment Application Providers) වෙත උපදෙස් දුන්නේය. මීට අමතරව, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සඳහා, 2024 අංක 01 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග නිකුත් කරන ලද අතර, එමගින් ඔවුන්ගේ මෙහෙයුම් ක්‍රමවත් කිරීමට සහ විධිමත් මාර්ග හරහා මුදල් පැවරීමේ ව්‍යාපාරයේ නිරත වීමට අවස්ථාව සැලසේ.

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

**ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් ජාතික අවදානම් ඇගයීම යාවත්කාලීන කිරීමේ කාර්යය මේ වන විටත් ආරම්භකර ඇති අතර අනතුරුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ප්‍රතිපත්තිය යාවත්කාලීන කරනු ඇත.** මෙම යාවත්කාලීන කිරීමට, බදු සහ සමූල ඝාතක අවි ප්‍රගුණනය සඳහා අරමුදල් සැපයීම පිළිබඳ අවදානම් තක්සේරු ද ඇතුළත් වන අතර, 2025 වසර මැද දී අවසන් කිරීමට නියමිතය. 2023-2028 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්තිය පිළියෙළ කිරීමේ දී, 2021/22 ජාතික අවදානම් තක්සේරුවෙහි හඳුනාගැනීම් මගින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය. මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කරගනිමින්, පාර්ශ්වකරුවන් 24 දෙනෙකු සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කළ අතර, එමගින් ශ්‍රී ලංකාව ගෝලීය මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රමිතීන්ට අනුකූල වීම ශක්තිමත් කරන ලදී. ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති අරමුණු සහ නියාමන අපේක්ෂාවන් සමඟ පෙළගැස්වීම සහතික කරමින්, එහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද කාර්ය සාධක බලකාය වසර තුළ පාර්ශ්වකරුවන් සමඟ රැස්වීම් 39ක් පැවැත්වීය. මීට අමතරව, 2026 වසරේ මාර්තු මාසයේ දී මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කණ්ඩායම විසින් පැවැත්වීමට නියමිත තුන්වන අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සූදානම් වීමේ දී, මහ බැංකුව විචක්ෂණශීලී අධීක්ෂකයෙකු ලෙස නියාමන රාමුව ශක්තිමත් කිරීමට සහ මූල්‍ය ආයතනවල අනුකූලතා අධීක්ෂණය ඉහළ නැංවීමට අඛණ්ඩව කටයුතු කරමින් සිටියි.

**මූල්‍ය බුද්ධි ඒකකය, තම නියාමන අධීක්ෂණයේ කොටසක් ලෙස, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, මූල්‍ය ආයතන සහ රක්ෂණ සමාගම් සඳහා**

3

3

**පාරිභෝගිකයින් පිළිබඳව නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ අවශ්‍යතා, පරිසීමිත අලෙවිකරුවන් සහ වටිනා ලෝහ හා මැණික් ගල් අලෙවිකරුවන් සඳහා වන අවශ්‍යතා සමඟ අනුකූල වීමට 2024 වසර තුළ චක්‍රලේඛ කිහිපයක් නිකුත් කර ඇත.** මෙම පියවර මහ බැංකුවේ නියාමන ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම, මූල්‍ය අංශයේ සුපිළිපන්භාවය ශක්තිමත් කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත පරිචයන් පිළිපැදීම සහතික කිරීම සඳහා වන පුළුල් උපාය මාර්ගයක කොටසකි. මෙම මුලපිරීම් මගින්, සාමූහිකව ගත් කල, මූල්‍ය ස්ථායීතාව පවත්වා ගැනීම, අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ නීති විරෝධී මූල්‍ය ප්‍රවාහයන්ගෙන් ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා මහ බැංකුවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කෙරේ.

## මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති

**2024 වසර තුළ දී, රටේ මූල්‍ය අංශය තුළ මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කිරීම උදෙසා මහ බැංකුව විසින් තීරණාත්මක පියවර රැසක් ගනු ලැබීය.** 2024 වසරේ අගෝස්තු 9 වන දින සිට මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි පූර්ණ වශයෙන් බලාත්මක වීම මෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෙම රෙගුලාසි මගින් මූල්‍ය සේවාවන්හි සාධාරණත්වය, විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම, පාරිභෝගිකයන්ට සමානව සැලකීම, සහ පැහැදිලි හා නිවැරදි තොරතුරුවලට ප්‍රවේශවීම සඳහා ඇති හැකියාව තහවුරු කරන ලදී.

**මෙම රෙගුලාසිවල තවත් වැදගත් අංගයක් වන්නේ එමගින් මහ බැංකුවට වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණය කිරීම සඳහා බලය ලබාදීමයි.** මෙමගින්, මූල්‍ය ආයතන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවලට අනුගතවීම හා පාරිභෝගික අයිතීන් ඵලදායී ලෙස ආරක්ෂා කිරීම නියාමනය කිරීමට මහ බැංකුවට අවස්ථාව සැලසේ. මෙවැනි ක්‍රමවත් ඇගයීම් සිදුකිරීමෙන්, නියාමන අධිකාරිය ලෙස, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ දී පවතින හිඩැස් හෝ අභියෝග හඳුනාගැනීමට අවස්ථාව ලැබෙන අතර, අනාගතයේදී වෙළඳපොළ හැසිරීම පිළිබඳ නව රෙගුලාසි සම්පාදනය කිරීමේ දී එම රෙගුලාසි යොදා ගත හැකිය.

## තැන්පතු රක්ෂණය සහ මූල්‍ය ආයතනවල නිරාකරණ පිළිබඳ ප්‍රතිපත්ති

**2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ රාමුව ශක්තිමත් කිරීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් මහ බැංකුව විසින් 2024 වසරේ දී ලබා ගන්නා ලදී.** මේ අනුව, ඵලදායී නිරාකරණ උපාය මාර්ග සඳහා මූලික පියවර තබමින්, බැංකු (විශේෂ විධිවිධාන) පනතට අනුකූලව "නිරාකරණ ප්‍රතිපත්තිය" නිර්මාණය කරන ලදී. තවද, මෙම වසර තුළ දී පූර්ව මැදිහත්වීමේ ක්‍රියාවලිය සක්‍රීය කිරීම සහ මූල්‍ය අංශයේ අර්බුද පූර්ව කළමනාකරණය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ ප්‍රේරක සාර්ථකව ස්ථාපිත කරන ලදී. නිරාකරණ සැලසුම් සඳහා සහාය වීමේ අරමුණෙන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා නියෝගයන් නිකුත් කරන ලදී. මීට අමතරව, අර්බුදකාරී අවස්ථාවන්හි දී ක්‍රමවත් ක්‍රියාවලියක් පැවතීම සහතික කිරීම සඳහා තෝරාගත් බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ සැලසුම් සකස් කෙරෙමින් පවතී. තවද, තැන්පතු රක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වෙත 2024 අංක 02 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගයන් මහ බැංකුව විසින් නිකුත් කරන ලදී.

**මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස සහ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂිත තැන්පතු ආපසු ගෙවීම සිදුකරන ආකාරය පිළිබඳව නව මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදී.** මෙම මාර්ගෝපදේශ නිකුත් කිරීම මගින් හිමිකම් ඉදිරිපත් කිරීමේ සහ රක්ෂණ වන්දි මුදල් ගෙවීමේ ක්‍රියා පටිපාටිය විධිමත් සහ කඩිනම් කරමින් රක්ෂිත තැන්පත්කරුවන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම අරමුණු කර ඇත. මීට අමතරව, ගැටලු ඵලදායී ලෙස නිරාකරණය කිරීම සඳහා සහ සීමාවන් තවදුරටත් නිරවද්‍ය ලෙස අවබෝධ කරගැනීම සඳහා, බැංකු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක (Unique Identification Numbers) සටහන් කිරීම අනිවාර්ය කිරීම පිළිබඳ 2024 අංක 01 දරන මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. මෙම මෙහෙයුම් උපදෙස් මගින් තැන්පත්කරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම මෙන්ම වන්දි ගෙවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරයි.

## විශේෂාංග සටහන
## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

| මුදල් ප්‍රතිපත්තිය | |
|---|---|
| 2024 පෙබරවාරි 09 | 2024 පෙබරවාරි 16 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය ණය පහසුකම මත පනවා තිබූ සීමාව ඉවත් කෙරුණු අතර, නිත්‍ය තැන්පතු පහසුකම මත පනවා තිබූ සීමාව මාසයක් තුළ පස් වතාවක (05) සිට දස වතාවක් (10) දක්වා ලිහිල් කරන ලදී.[2] |
| 2024 මාර්තු 26 | 2024 අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම සඳහා පැවති සීමාව ඉවත් කරන ලදී.<br><br>නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 8.50%ක් සහ 9.50%ක් දක්වා අඩු කරන ලදී. |
| 2024 ජූලි 24 | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 8.25%ක් සහ 9.25%ක් දක්වා අඩු කරන ලදී. |
| 2024 නොවැම්බර් 27 | මහ බැංකුව පැවති ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත යොමු විය. ඒ අනුව, මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීමට භාවිතා කරන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) හඳුන්වා දෙන ලද අතර එය පදනම් අංක 50ක අඩු කිරීමක් පිළිබිඹු කරමින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00%ක් ලෙස තීරණය කරන ලදී. තවද, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක ± 50ක ආන්තිකයක් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කරමින්, පිළිවෙළින්, 7.50% සහ 8.50%ක් ලෙස නම් කරන ලදී.[3] |
| **විශේෂ ණය යෝජනා ක්‍රම** | |
| 2024 ජනවාරි 03 | ඉදිරියේ දී රජයේ අරමුදල් මගින් හෝ අරමුදල් සපයනු ලබන නියෝජිත ආයතනවල අරමුදල් භාවිතයෙන් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක නොකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. නමුදු දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ණය යෝජනා ක්‍රමයන්හි මෙහෙයුම් කාලය අවසන් වනතෙක් එම ණය යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ඇත. |
| **ගෙවීම් හා පියවීම්** | |
| 2024 අප්‍රේල් 20 | 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ විධිවිධාන යටතේ 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග නිකුත් කරන ලදී. ඒ අනුව, මෙම නියෝග මගින් සියලුම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් 2024 වසරේ ජූනි 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම අවශ්‍ය වන අතර, එමගින් ලියාපදිංචි නොකළ හෝ බලපත්‍ර රහිත මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් හට ඔවුන්ගේ මෙහෙයුම් විධිමත් කිරීමට සහ විධිමත් මාර්ග හරහා මුදල් හුවමාරු ව්‍යාපාරයේ නිරත වීමට අවස්ථාව ලබා දේ. |

1 2024 ජනවාරි 01 සිට 2025 මාර්තු 15 දක්වා වන කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

2 මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත සහභාගීත්ව ආයතන අධික ලෙස රඳා පැවතීම අඩු කිරීමේ අරමුණින්, 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය පහසුකම් සඳහා සීමාවන් පනවන ලදී.

3 නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලබන අතර, සහභාගීත්ව ආයතනවලට නිත්‍ය පහසුකම් සඳහා අදාළ වන අනුපාතික ලෙස අඛණ්ඩව ක්‍රියා කරයි.

2024 ජනවාරි 01 සිට 2025 මාර්තු 15 දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ එයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ එම කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සවිස්තරාත්මක අනුවාදයක් මාර්ගගතව ලබා ගත හැක.

යොමුව : ප්‍රධාන මෙනුව → ප්‍රකාශන → ආර්ථික සහ මූල්‍ය වාර්තා → වාර්ෂික ආර්ථික විවරණය → වාර්ෂික ආර්ථික විවරණය 2024 → ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

සබැඳිය : https://www.cbsl.gov.lk/si/ප්‍රකාශන/ආර්ථික-හා-මූල්‍ය-වාර්තා/වාර්ෂික-ආර්ථික-විවරණය/වාර්ෂික-ආර්ථික-විවරණය-2024/ප්‍රධාන-ආර්ථික-ප්‍රතිපත්තිමය-ක්‍රියාමාර්ග

| | |
|---|---|
| 2024 දෙසැම්බර් 03 | ගනුදෙනුකරුවන්ගේ ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම් අනවසර ප්‍රවේශයන්ගෙන් ආරක්ෂා කරගැනීම අරමුණු කර ගනිමින්, ගෙවීම් යෙදුම් වෙත ලියාපදිංචි වීමේදී පරිශීලකයා හඳුනා ගැනීම සහ පරිශීලකයින් විසින් සපයනු ලබන තොරතුරු තහවුරු කරගැනීම සඳහා තොරතුරු ලබාගැනීමට සුදුසු යාන්ත්‍රණයක් 2025 වසරේ මාර්තු 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපිත කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම ජංගම ගෙවීම් යෙදුම් සැපයුම්කරුවන් හට උපදෙස් ලබාදෙන ලදී. තවද, ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම් ජස්ටිපේ පහසුකම සහිත ගෙවීම් යෙදුමකට සම්බන්ධ කිරීමේ දී ගෙවීම් යෙදුමේ පරිශීලකයා සහ ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම්හි හිමිකරු එකම අයෙකු බව සහතික කරගන්නා ලෙස ජංගම ගෙවීම් යෙදුම් සැපයුම්කරුවන් වෙත උපදෙස් දෙන ලදී. |
| 2025 ජනවාරි 27 | ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා, ඩිජිටල් ගෙවීම් ලබාගැනීමට හැකි තොරතුරු තාක්ෂණ පද්ධතියක් නොමැති රාජ්‍ය ආයතන වෙත ඩිජිටල් ගෙවීම් පිළිගැනීම පහසු කිරීමට හඳුන්වාදුන් ගෙවීම් වේදිකාව වන GovPay හරහා සිදු කරනු ලබන එක් ගනුදෙනුවක් සඳහා අයකළ හැකි උපරිම ගාස්තුව 2025 වසරේ පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 15/-ක් ලෙස නියම කරන ලදී. |

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම**

| | |
|---|---|
| 2024 අප්‍රේල් 01 | 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ ආයතන විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත අනිවාර්යයෙන් ලබා දිය යුතු වාර්තා සම්බන්ධයෙන් වන අනුකූලතාවය පිළිබඳව ආයතන වෙත 2024 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2024 සැප්තැම්බර් 05 | මූල්‍ය ආයතන විසින්, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්ට අනුකූලවීම සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත 2024 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2024 සැප්තැම්බර් 19 | රක්ෂණ ආයතන විසින් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්ට අනුකූලවීම සම්බන්ධයෙන් රක්ෂණ ආයතන වෙත 2024 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2024 ඔක්තෝම්බර් 02 | 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන යටතේ පරිසීමිත වෙළඳුන්ගේ ආයතනික අනුකූලතාව සහතික කිරීම සම්බන්ධයෙන් පරිසීමිත වෙළඳ ආයතන වෙත 2024 අංක 03 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2024 නොවැම්බර් 04 | 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සහ 2018 අංක 1 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්ට අනුකූල වීම සම්බන්ධයෙන් 2024 අංක 04 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර කටයුතු**

| | |
|---|---|
| 2024 ජනවාරි 01 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ 2023 වසරේ පෙබරවාරි 27 දිනැති ජංගම ගනුදෙනු සඳහා වන "විශේෂ විදේශ මුදල් ගිණුම් - ආයෝජිතයා" යන මැයෙන් නිකුත් කරන ලද 2023 අංක 01 දරන විධාන සංශෝධනය කිරීම සඳහා 2024 අංක 01 දරන විධාන නිකුත් කරන ලද අතර එමගින් මෙම ගිණුම් විවෘත කිරීමේ වලංගු කාලය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී. |
| 2024 පෙබරවාරි 15 | 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී නිෂ්කාශන ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද රීති ප්‍රකාර ව "සුරැකුම්පත් ණයට ගැනීම ණයට දීම" යන ගනුදෙනු යටතේ කොළඹ කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත කර ඇති සුරැකුම්පත් අත්පත් කර ගැනීමට, විකිණීමට හෝ ඇපයට තැබීමට අනේවාසිකයන්ට අවසර දීමේ අරමුණින්, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2021 පෙබරවාරි 15 දිනැති අංක 2371/31 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් 2024 අංක 02 දරන විධාන 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී. |
| 2024 පෙබරවාරි 16 | නේවාසික සමාගම්වලට අනේවාසිකයින්ගෙන් වසර 3 කට අඩු කාලයක් සඳහා ණය ලබාගැනීමට ඇති අවසරය අවලංගු කිරීම සහ නේවාසික සමාගමට ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති විට ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් දැනටමත් ලබාගෙන ඇති එවැනි ණය සඳහා ආපසු ගෙවීම් සිදු කිරීමට අවසර ලබා දීමේ අරමුණින් 2021 වසරේ පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2024 වසරේ පෙබරවාරි 16 දිනැති අංක 2371/48 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් වන 2024 අංක 3 දරන උපදෙස් 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී. |

| | |
|---|---|
| | ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති විට ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් අනේවාසික පුද්ගලයන්ට හිමි ලැයිස්තුගත ණය සුරැකුම්පත් සහ ලැයිස්තුගත කොටස් සම්බන්ධ ආදායම් හෝ කල්පිරුම් සඳහා ගෙවීම් සිදු කිරීමට අවසර ලබා දීමේ අරමුණින් 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/49 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් වන 2024 අංක 04 දරන විධාන 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී.<br><br>අනේවාසිකයින්ගෙන් ලබා ගත් ණය වලින් ලැබෙන මුදල් භාවිත කරමින් නේවාසික සමාගම්වලට ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවසර ලබා දී ඇති 2021 ජූනි 30 දිනැති අංක 2234/20 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2021 අංක 06 දරන රෙගුලාසි අවලංගු කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/50 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවලට ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි නිකුත් කරන ලදී. |
| 2024 ජූනි 18 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අතර 2023 වසරේ දෙසැම්බර් 20 දිනැති අංක 2363/26 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද නියෝගය යටතේ පනවන ලද යම් ප්‍රාග්ධන ප්‍රවාහ පියවර කිහිපයක් ලිහිල් කිරීමේ අරමුණින් 2024 ජූනි 18 දිනැති අංක 2389/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝගය නිකුත් කරන ලදී. |
| 2024 ජූලි 01 | 2024 ජූලි 01 දිනැති අංක 2391/02 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2024 අංක 01 දරන අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධ රීති, 2023 අංක 16 දරන මහ බැංකු පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද අතර එමගින් අපනයන ආදායම්වල ඉතිරි කොටස සම්බන්ධ අනිවාර්ය පරිවර්තනය අවශ්‍යතාව සඳහා වන කාල සීමාව පෙර රීතිවල නියම කර තිබූ පරිදි, පසු මාසයේ 07 වන දිනට සාපේක්ෂව, එම ආදායම ලැබුණු දින සිට දින දර්ශන මාස තුනක් (ලැබුණු මාසය ද ඇතුළුව) කල් ඉකුත් වීමෙන් පසුව මාසයේ 10 වන දින දක්වා දීර්ඝ කරන ලදී. පාර්ලිමේන්තු අනුමැතියෙන් පසු මෙම රීති 2024 සැප්තැම්බර් 4 දින සිට බලාත්මක විය. |
| 2024 අගෝස්තු 01 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වීසා වැඩසටහන යටතේ නේවාසික වීසා ලබාගන්නා විදේශිකයන්ගේ ගනුදෙනු සහ පහසුකම් සැලසීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ 2024 අංක 05 දරන විධානය සහ 2024 අංක 06 දරන විධාන නිකුත් කරන ලදී. |
| 2024 දෙසැම්බර් 19 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අංක 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2024 ජූනි 18 දිනැති අංක 2389/08 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝග යටතේ පනවන ලද යම් ප්‍රාග්ධන ප්‍රවාහ පියවර තවත් මාස 6 කට දීර්ඝ කරමින් සහ එවැනි පියවරවල ඇතැම් අඩුලුහුඩුකම් සපුරාලීමේ අරමුණින් 2024 දෙසැම්බර් 19 දිනැති අංක 2415/56 දරන අතිවිශේෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝගය නිකුත් කරන ලදී. |
| **රාජ්‍ය ණය කළමනාකරණය** | |
| 2024 මාර්තු 11 | 2024 වසරේ මාර්තු 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2024 වසරේ මාර්තු 07 වන දින නිකුත් කරන ලද සංශෝධිත විධානයන්ට අනුව, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී දෙවන අදියර සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේ දී සමස්ත වෙන්දේසි හිඟය සහ ඉදිරිපත් කරන ලද මුළු වටිනාකමින් 10%ක් හෝ රුපියල් බිලියන 5ක් (යන අගයන්ගෙන් ඉහළ අගය) දක්වා අඩු කර ඇත.<br><br>2024 වසරේ මාර්තු 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2024 වසරේ මාර්තු 07 දින නිකුත් කරන ලද සංශෝධිත විධානයන්ට අනුව, භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල දී සෘජු නිකුතු කවුළුව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේ දී සම්පූර්ණයෙන්ම පිළිගනු ලැබූ සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංක සඳහා ඉදිරිපත් කරන ලද වටිනාකමින් 10% දක්වා අඩු කර ඇත. |
| 2024 අප්‍රේල් 01 | රජයේ සුරැකුම්පත් ආයෝජනවලට අදාළ මුද්‍රිත කාලීන ප්‍රකාශන යැවීම අත්හිටුවනු ලැබූ අතර, එය සම්පූර්ණයෙන් ම විද්‍යුත් ප්‍රකාශන පහසුකම බවට පරිවර්තනය කරන ලදී. මේ සඳහා ලංකාසෙක්‍යු පද්ධතියේ (Lanka Secure System) සියලුම සුරැකුම්පත් ගිණුම් හිමියන් සඳහා වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයන් යාවත්කාලීන කිරීම අනිවාර්ය වේ. |

3

**2024 දෙසැම්බර් 20**

විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISBs) හුවමාරුව සුදුසුකම් ලත් බැඳුම්කර හිමියන්ගෙන් 97.86%කගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක විය.

එම හුවමාරුව තුළ බැඳුම්කර හිමියන්ට උපචිත පොලී සඳහා 2028 කල්පිරෙන බැඳුම්කරයක්, ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත ආර්ථික කාර්යසාධන හා බැඳුනු බැඳුම්කර හතරක් (04), ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලි අනුපාතික සහිත යහපාලනය හා බැඳුණු බැඳුම්කරයක් සහ එක් ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලි අනුපාතික සහිත එ.ජ. ඩොලර් බැඳුම්කරයක් පහත දැක්වෙන පරිදි නිකුත් කරන ලදී.

| විස්තරය | කූපන් අනුපාතය (%) | මුල් මුදල (එ.ජ. ඩොලර්) |
|---|---|---|
| උපචිත පොලි සඳහා 2028 වසරේ දී කල්පිරෙන බැඳුම්කරය | 4.0 | 1,647,735,257 |
| ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2030 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය | 3.1 | 1,086,993,557 |
| ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2033 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය | 3.35 | 2,132,120,275 |
| ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2036 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය | 3.6 | 999,165,345 |
| ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2038 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය | 3.6 | 1,999,171,191 |
| ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2035 වසරේ දී කල්පිරෙන යහපාලනය හා බැඳුණු බැඳුම්කරය | 3.6 | 1,439,672,065 |
| ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2038 වසරේ දී කල්පිරෙන එ.ජ. ඩොලර් බැඳුම්කරය | 1.0 | 1,126,487,250 |

මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මීට අමතරව, බැඳුම්කර හුවමාරුව සඳහා වූ යෝජනාව කල් ඉකුත්වන දිනට හෝ ඊට පෙර, පවතින බැඳුම්කර මාලාවක් සම්බන්ධයෙන් වන වලංගු උපදෙස් ලබා දී ඇති බැඳුම්කර හිමියන් සඳහා හුවමාරු ගාස්තු ගෙවීම් සඳහා, එ.ජ. ඩොලර් 215,237,873ක වටිනාකමින් යුත් එ.ජ. ඩොලර්වලින් නාමනය කරන ලද "හුවමාරු ගාස්තු" බැඳුම්කර නිකුත් කරන ලදී. තවද, ජාත්‍යන්තර බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ දේශීය විකල්පය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 155,728.6 වන නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා සම්බන්ධිත නව භාණ්ඩාගාර බැඳුම්කර අටක් (08) නිකුත් කරන ලදී.

**2024 දෙසැම්බර් 30**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ශ්‍රී ලංකා රුපියල් මගින් ණය පියවීම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා සම්බන්ධිත නව භාණ්ඩාගාර බැඳුම්කර පහක් (05) නිකුත් කරන ලදී.

## මූල්‍ය අංශය

### බලපත්‍රලාභී බැංකු

**2024 මාර්තු 25**

සිදුවිය හැකි ණය සංකේන්ද්‍රණ අවදානම අවම කරමින් බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාවය සහ ශක්තිමත්භාවය තහවුරු කර ගැනීම සහ මහජන විශ්වාසය ආරක්ෂා කිරීමේ අරමුණින්, 2026 ජනවාරි 01 දින සිට බලාත්මක කිරීමට නියමිතව, "බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණයවීම්" පිළිබඳ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

**2024 මාර්තු 28**

දැනටමත් බලපත්‍රලාභී බැංකුවල ස්ථාපිත පශ්චාත් කොවිඩ්-19 යළි පණගැන්වීමේ ඒකක තවදුරටත් ශක්තිමත් කරමින් සහ එම ඒකක, ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක ලෙස වැඩිදියුණු කරමින්, සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර තිරසාර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසීමේ අරමුණින් සහ බලපත්‍රලාභී බැංකුවල ඉහළ යන අක්‍රීය ණය නිසි ලෙස හැසිරවීම තහවුරු කිරීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

**2024 ජූනි 13**

2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 21(1) සහ 76(ඌ) වගන්ති ප්‍රකාරව, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යාම අත්හිටුවමින්, සෑම බලපත්‍රලාභී බැංකුවක් ම, බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත ලෙස, ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායි අරමුදල් අනුපාතය පවත්වා ගත යුතු බව නීර්ණය කරමින්, "බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත" යන බැංකු පනත් නීර්ණය නිකුත් කරන ලදී.

| | |
|---|---|
| 2024 ජූනි 14 | 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ, අක්වෙරළ බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාමට පහසුකම් සැලසීමේ අරමුණින් "බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු" පිළිබඳ වන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. අක්වෙරළ බැංකු ව්‍යාපාර සිදු කිරීම සඳහා අවසරලත් ව්‍යාපාර, සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්, අවසර ලත් ගනුදෙනු සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර යටතේ ලබා දිය හැකි ණය යනාදිය මෙම විධානයන් මගින් නිශ්චිතව දක්වනු ලැබේ. තවද, බැංකු (අක්වෙරළ බැංකු කටයුතු පටිපාටිය) නියෝග සහ එවැනි අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ඒකක සඳහා අදාළ වූ නියෝග අහෝසි කරමින් බැංකු පනත් නියෝගයක් නිකුත් කරන ලදී. |
| 2024 ජූනි 15 | බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ වන නීතිමය සහ නියාමන රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් කෙටුම්පත් කරන ලද බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත, 2024 අප්‍රේල් 02 දින පාර්ලිමේන්තුවේ දී අනුමත කරන ලද අතර, එය 2024 ජූනි 15 දින සිට 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත ලෙස ක්‍රියාත්මක විය. මෙම සංශෝධන මගින්, බලපත්‍රයක් අයදුම් කිරීම සඳහා වන අවම අවශ්‍යතාවයන්, කොටස් හිමියන්ගේ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායක, බැංකු හිමිකාරිත්වය, අත්පත් කර ගැනීම්, එක් කිරීම සහ ඒකාබද්ධ කිරීම්, ඒකාබද්ධ අධීක්ෂණය, සමානුපාතිකත්වය, ගිණුම් සහ විගණනය පිළිබඳ අවශ්‍යතා, විශාල ගනුදෙනු නිරාවරණයන්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, ආයතනික යහපාලනය, අක්වෙරළ බැංකු ව්‍යාපාර යනාදිය සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කර ඇත. |
| 2024 ජූලි 19 | සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය විසින් ඇපවන නිරාවරණ ප්‍රමාණය සඳහා 20%ක අවදානම මත බර තැබීමක් නියම කරමින් "බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතාවන්" පිළිබඳ 2016 අංක 01 දරන බැංකු පනත් විධානවලට සංශෝධන නිකුත් කරන ලද අතර, ඒ අනුව දක්වන ලද විධානයන්හි භාවිතය සඳහා මූල්‍ය ආයතනවල නම් ලැයිස්තුවට සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය ද ඇතුළත් කරන ලදී. |
| 2024 සැප්තැම්බර් 30 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමන අවශ්‍යතා වැඩිදියුණු කිරීම ඇතුළුව අවදානම් අධීක්ෂණය සහ පාලන කාර්යයන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම තුළින් බලපත්‍රලාභී බැංකුවල ආයතනික යහපාලන ක්‍රියාවලීන් සහ භාවිතයන් ශක්තිමත් කිරීම වැනි අරමුණු ඇතිව, "බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික යහපාලනය" පිළිබඳව වන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2024 ඔක්තෝබර් 01 | බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ඇතිවිය හැකි සබැඳියාවන් පිළිබඳ ගැටුම් අවම කිරීම සහ සම්බන්ධිත පාර්ශ්වයන් හට වඩාත් වාසිදායක සැලකිල්ලක් දැක්වීම වැළැක්වීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකුවලට අදාළ සම්බන්ධිත පාර්ශ්වයන් සහ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහක සම්බන්ධයෙන් අනුමත සුරැකුම්පත් නිශ්චිතව සඳහන් කරමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී. තවද, මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද බැංකු පනත් විධාන අවලංගු කරන ලදී. |
| 2024 ඔක්තෝබර් 03 | බලපත්‍රලාභී බැංකු විසින් අදාළ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන් වන අනුමත සීමාවන් දක්වමින් ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2024 දෙසැම්බර් 19 | ශ්‍රී ලංකා බැංකු සංගමය එකඟ වූ පරිදි, පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීනව පැවති සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදිය යුතු සහන අවධාරණය කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2025 ජනවාරි 01 | බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහන සැලසීම පිළිබඳ වන 2024 අංක 04 දරන චක්‍රලේඛයෙහි දක්වන ලද සහන, සියලුම බලපත්‍රලාභී බැංකු මගින් ඵලදායී සහ ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අරමුණින්, එම චක්‍රලේඛයෙහි අන්තර්ගතය තවදුරටත් පැහැදිලි කරමින් එකී චක්‍රලේඛයට අතිරේකයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික යහපාලනය පිළිබඳ විධාන සඳහා අතිරේකය.<br>ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිරින් සේවාවන් ලබා ගැනීම පිළිබඳ විධාන.<br>වෙළඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීම පිළිබඳ රාමුව. |

## මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්

| | |
|---|---|
| 2024 පෙබරවාරි 13 | මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතු සිදු කෙරෙන ආකාරය දැනගැනීම හෝ වෙනත් යම් නිශ්චිත වූ අරමුණක් සඳහා මුදල් සමාගම්වල කාලීන, නිරවද්‍ය, අඛණ්ඩ සහ පූර්ණ තොරතුරු ලබා ගැනීමේ අරමුණින් කාලාවර්තක වාර්තා කිරීමේ අවශ්‍යතා පිළිබඳ විධානය නිකුත් කරන ලදී. |
| 2024 මැයි 03 | ණය අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය, ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා විචක්ෂණ සීමා ඇතුළත් ණය අවදානම් පාලන ව්‍යුහය සැකසීම සහ ණය අවදානම හඳුනාගැනීම, මැනීම, නිරීක්ෂණය සහ පාලනය සඳහා ඵලදායී පද්ධතියක් පවත්නා බවට තහවුරු කිරීම මගින් ශක්තිමත් ණය අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමේ අරමුණින් ණය අවදානම් කළමනාකරණය පිළිබඳ විධානය නිකුත් කරන ලදී. |
| 2024 ඔක්තෝබර් 23 | මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා වැටුප් ලබා දීමේ දී ස්ථාවර බව, සාධාරණත්වය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් වැටුප් ප්‍රතිපත්ති සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |

| | |
|---|---|
| 2024 නොවැම්බර් 21 | තැන්පතු භාරගැනීම, වෙළඳ දැන්වීම් පළකිරීම සහ තැන්පතු දිරිගැන්වීමේ යෝජනාක්‍රම ඉදිරිපත් කිරීමට අදාළව කොන්දේසි නියම කිරීම තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ මුදල් සමාගම් අතර සාධාරණ තරගකාරීත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, මුදල් සමාගම් විසින් තැන්පතු කැඳවීම පිළිබඳ විධානය නිකුත් කරන ලදී. |
| 2024 නොවැම්බර් 29 | මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා කාර්ය පටිපාටි, මෙහෙයුම් අවදානම් පාලන ව්‍යුහය සහ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සේවා සැපයීම තහවුරු කරමින් මෙහෙයුම් අවදානම හඳුනාගැනීම, තක්සේරු කිරීම, නිරීක්ෂණය හා වාර්තා කිරීම සහ අවම කිරීම හා පාලනය, මුදල් සමාගම පුරා ක්‍රියාත්මක කිරීම සඳහා වන ඵලදායී මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලි සැකසීම තුළින් ශක්තිමත් මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමේ අරමුණින්, මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ විධානය නිකුත් කරන ලදී. |
| 2024 දෙසැම්බර් 27 | ඒකාබද්ධකරණ සැලැස්මෙහි I වන අදියර නිමාවට පත් වීමත් සමඟ, මැදි සහ දිගු කාලයේ දී වඩාත් තිරසර මුදල් සමාගම් අංශයක් ඇති කිරීමේ අරමුණින්, ඒකාබද්ධකරණ සැලැස්මෙහි සංශෝධිත II වන අදියර මුදල් සමාගම් අංශය සඳහා හඳුන්වා දෙන ලදී. මෙම සංශෝධිත රාමුව 2025 මාර්තු 31 සිට 2028 මාර්තු 31 දක්වා විහිදෙන තුන් අවුරුදු කාලසීමාවක් තුළ ක්‍රියාත්මක වීමට නියමිතය. |
| අපේක්ෂිත | මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණ පනතට සිදු කරන සංශෝධන ඇතුළුව, වර්තමාන වෙළෙඳපොළ ප්‍රවණතා සමඟ අනුකූලවන පරිදි පවත්නා නියාමන රාමුව සංශෝධනය කිරීම. |
| **මූල්‍ය අංශයට අදාළ වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග** | |
| | **ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය.** ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය[4] සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ණය ගිවිසුම් අත්සන් කරන ලදී. |
| 2024 ජනවාරි 31 | ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය[4] අතර අත්සන් කරන ලද මූල්‍ය ගිවිසුම |
| 2024 පෙබරවාරි 01 | ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කරන ලද ව්‍යාපෘති ගිවිසුම |
| 2024 පෙබරවාරි 06 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය[4] සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කරන ලද අනුබද්ධ ගිවිසුම. |
| 2024 අප්‍රේල් 10 | නියාමන ආංශික අධීක්ෂණය ශක්තිමත්කිරීම හා මූල්‍ය පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම තහවුරුකිරීම පිණිස මූල්‍ය පාරිභෝගික අධීක්ෂණ රෙගුලාසි යටතේ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ අංශය ස්ථාපිත කර ඇත. මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන අතර වෙළඳපොළ හැසිරීමට අදාළ ප්‍රමිතීන් සඳහා අනුකූලතාවය, නියාමනය කිරීම, ඇගයීම හා බලාත්මකකිරීම ආදියෙහි දී මෙම අංශය තීරණාත්මක භූමිකාවක් ඉටුකරයි. |
| 2024 මැයි 21 | ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය හැසිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් සියළු මූල්‍ය සාක්ෂරතා පාර්ශ්වකරුවන් හට සාක්ෂිමත පදනම් වූ මාර්ගෝපදේශකත්වයක් සැපයීම සඳහා, මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපාය මාර්ගය යටතේ, ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028) එළි දක්වන ලදී. |
| 2024 ජූලි 17 | **මූල්‍ය පද්ධති ස්ථායීතාවය සහ අර්බුද කළමනාකරණය** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරාකරණ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම උදෙසා 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ අර්බුද කළමනාකරණය සඳහා ඇති සූදානම වැඩි දියුණු කරන ලදී. පුළුල් නිරාකරණ ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම මගින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථායීතා රාමුව ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන් සමඟ සමපාත කරවීම සිදුවන අතර, පීඩාවට පත් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රවේශයක් සහතික කරයි. |
| 2024 අගෝස්තු 08 | 2023 අගෝස්තු 8 වනදින නිකුත් කරන ලද 2023 අංක 1 දරන මූල්‍ය ආරක්ෂණ රෙගුලාසි 2024 වසරේ පෙබරවාරි 08 දින සිට අර්ධ වශයෙන් බලාත්මක වූ අතර 2024 වසරේ අගෝස්තු 08 වන දින සිට පූර්ණ වශයෙන් ද බලාත්මක විය. |
| 2024 නොවැම්බර් 01 | 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති පරිදි මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීමේ අරමුණට දායක වෙමින් ණය උපදේශන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සමඟ එක්ව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. |

4 ගිවිසුම් අත්සන් කරනු ලැබූ අවස්ථාවේ දී අමාත්‍යාංශයේ නම සඳහන් වූයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යනුවෙනි.

3